# (ඇ) මුදල් හා බැංකු කටයුතු හැඩගැස්ම

## 1. (අ) මුදල් සැපැයුම

1967 දෙසැම්බර් අගදී වූ මුදල් සැපයුම වන රුපියල් දශ ලක්ෂ 1807·6, ඉකුත් වර්ෂය අගදී පැවති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 148·7 කින් හෙවත් සියයට 9 කින් වැඩිය. කෙසේ වෙතත් 1967 තුළදී පැවැති මුදල් සැපැයුමේ මාසික සාමාන්‍ය මට්ටම වන රුපියල් දශ ලක්ෂ 1732·3, ඉකුත් වර්ෂයේදී පැවැති රුපියල් දශ ලක්ෂ 1686·3 ට වඩා වැඩි වනුයේ සියයට 2·7 කිනි. මෙම තත්ත්වය 1966 තුළදී පැවති තත්ත්වය හා සසඳන විට, එකී වර්ෂයේ මුදල් සැපයුමේ, මාසික සාමාන්‍ය මට්ටම ඊට ඉහත වර්ෂයට වඩා සියයට 2·2 කින් වැඩි බව පෙනේ.

විමර්ශනයට ලක්ව ඇති වර්ෂය මුළුල්ලේ, මුදල් සැපැයුමෙහි වැඩිවීම, ඒකාකාර ලෙස සිදුවූයේ නැත. 11(ඈ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්වා දී ඇති පරිදි, ජනවාරි මාසයේ දී, ඊට පෙර අවුරුද්දේ අවසාන පස් මාසය තුළ දී දිස්වුණු මුදල් සැපැයුමෙහි තිබුණු අඩුවීමේ උපනතිය තවදුරටත් දක්නට ලැබුණි. පෙබරවාරියේ, සහ මාර්තුවේ දී මුදල් සැපැයුමෙහි අස්වාභාවික ප්‍රසාරණයක් සිදුවිය. මෙය ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු සේවකයන්ගේ වැඩ වර්ජනයක් හේතුකොට ගෙනය. වැඩ වර්ජනයෙන් පසු, බැංකු සේවාවන් යථා තත්ත්වයට පැමිණීමත් සමගම, අප්‍රේල් මාසයේ දී මුදල් සැපැයුම අඩුවීමේ උපනතිය ඇරඹුනි. අගෝස්තු අවසානය වන විට මුදල් සැපැයුම, වර්ෂය ආරම්භයේදී පැවැති මට්ටමට වඩා මඳක් ඉහළ මට්ටමකට වැටුණේය. කෙසේ වෙතත්, ඉකුත් වර්ෂයේ අවසාන මාස හතර තුළදී සිදු වූ මුදල් සැපැයුමේ තිබුණු පිරිහීම හා සංසන්දනය කරන කල, මෙම වර්ෂයේ එම කාලය තුළදී, මුදල් සැපයුම මාසයට රුපියල් දශ ලක්ෂ 32.5 ක තරම් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීම කැපී පෙනේ. පසුගිය වර්ෂ දෙකේ දී වූ අත් දැකීම මෙසේ වෙනස් වීමට හේතු වූයේ, 1966 අවසාන මාස හතරේ දී දක්නට ලැබුණු විදේශීය බැංකු වත්කම් පිරිහීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ, සංකෝචනාත්මක බලපෑමට ප්‍රති විරුද්ධ ලෙස 1967 එම මාසවලදී රජයේ මුදල් කටයුතු පරිහරණය ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවීමය.

1966 හා 1967 වර්ෂ දෙක අතරේ මුදල් සැපැයුම වෙනස්වීමට හේතු වූ කාරණු මහජනයා අතැති මුදල් පරිමාවට බල පෑ ප්‍රසාරණාත්මක හා සංකොචනාත්මක සාධකයන්ගේ සාපේක්ෂ වැදගත්කම සම්බන්ධයෙන් පෙනෙන වෙනස තුළින් නිරූපනයවේ. දිවයිනෙහි ජාත්‍යන්තර ගෙවුම් ශේෂය තවදුරටත් අහිතකර තත්ව-යක පැවතුනත්, එමගින් 1967 වර්ෂයේ මුදල් සැපැයුම වෙත සිදු වූ සංකෝච-නාත්මක බලපෑම, 1966 සිදුවූ බලපෑමට වඩා අඩකටත් අඩු විය. කෙසේ වෙතත්, රජයේ පිස්කල් කටයුතු මගින් 1967 මුදල් සැපැයුම වෙත, ඉහත අවුරුද්දට වඩා වැඩි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවුනි. බැංකු ක්‍රමය හා පෞද්ගලික අංශය අතර සිදු වූ මූල්‍ය ගනුදෙනු මගින්, මුදල් සැපැයුම වෙත ඇති වූ බලපෑමේ ශුද්ධ ප්‍රතිඵලය තරමක සංකෝචනයකි. මෙය, 1966 මුදල් සැපැයුම වෙත වූ සැහෙන ප්‍රමාණයේ ප්‍රසාරණ බලපෑම හා සැසඳේ.

## (I) (අ) මුදල් සැපැයුමට බලපාන සාධක[1]

මුදල් සැපැයුමට බලපාන සාමාන්‍ය සාධකයන් පිළිබඳ විශ්ලේෂණයක් II (ඇ) 2 සංඛ්‍යා සටහනෙන් ඉදිරිපත් කර ඇත. මෙම සටහනෙහි පෙන්වා දී ඇති ප්‍රධාන ආර්ථික අංශයන් තුනෙහි ක්‍රියාවලියන් අතුරින්, රාජ්‍ය අංශයේ ක්‍රියාවලිය වෙත විමර්ශනයට භාජනය වන වර්ෂයෙහි මූල්‍ය ප්‍රසාරණය සම්බන්ධයෙන් තනි වගකීම, පැවරෙන බව පෙනී යනු ඇත. රාජ්‍ය මුදල් කටයුතු මගින් සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑමේ ප්‍රමාණය, මුදල් සැපැයුමෙහි දක්නට ලැබුනු ශුද්ධ ඉහළයාමට වඩා ඈත්ත වශයෙන්ම වැඩි විය. මෙකී විශාල ප්‍රසාරණාත්මක බලපෑම විදේශීය අංශයෙන් හා මදක් දුරට පෞද්ගලික අංශයෙන් පැමිණි සංකෝචනාත්මක බලපෑම් වලින් අඩු වී ගියේය.

පසුගිය වර්ෂ කිහිපය තුළ දී රාජ්‍ය මූල්‍ය මගින් දිගින් දිගට ම සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම, 1965 දී රජයේ මුදල් හිඟය බොහෝ දුරට අවධානාත්මක නොවූ මාර්ගයන් මගින් පියවීමෙන් අඩු කළ බව පසුගිය වාර්ෂික වාර්තාවල සඳහන් කරන ලදී. මෙසේ 1966 දී රජය බැංකු නොවන මාර්ගයන්ගෙන් ගත් ණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතිය ද, රජයේ මුදල් හිඟය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල යාමෙන් බැංකු ක්‍රමයෙන් නැවත ණය ගැනීමට සිදු විය. 1967 දී ද මෙම පිළිවෙතම තව දුරටත් දක්නට ලැබුණි. ප්‍රසාරණය වන්නා වූ රජයේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස, බැංකු ක්‍රමයෙන් ලබාගත් සෑම වර්ගයක ම ණයෙහි ප්‍රසාරණයක් (වාණිජ බැංකු විසින් දරනු ලබන රජයේ පිළිනපත් හැර) අවශ්‍ය විය. මීට අතිරේක වශයෙන් රජයේ මුදල් ශේෂයන් ද සැහෙන ප්‍රමාණයකින් ප්‍රයෝජනයට ගනු ලැබීය. රජයේ මූල්‍ය අවශ්‍යතාවයන්ගෙන් කොටසක්, ආහාර ද්‍රව්‍ය රැස් කිරීම නිසා වුවමනා විය.

පසුගිය වර්ෂයේ දී, බැංකු ක්‍රමයෙන් ණය ගැනීමේ වැඩිවීම සිදුවූයේ, මහ බැංකුව වෙත පැවැති ණය ගැති බව වැඩිවීමත්, ඒ වෙනුවට වාණිජ බැංකු වෙත පැවති ණය ගැති බව අඩුවීමත් ස්වරූපයෙන්ය. 1967 වර්ෂයේ දී නම් ණය ගැති බව මහ බැංකුව සහ වාණිජ බැංකු යන දෙකොටස වෙත ම සැලකිය යුතු අන්දමින් වැඩි විය. මහ බැංකුව විසින් දරන ලද රජයේ සහ රජය ඇප වූ සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 109.9 කින් වැඩි වූ අතර, රජයට සැපැයුනු අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12.7 කින් වැඩි විය. වාණිජ බැංකු විසින් දරන ලද, රජයේ සහ රජය ඇප වූ සුරැකුම් පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 62.3 කින් අඩුවීම, ඔවුන් විසින් දරන රජයේ ආනයන බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 139.5 කින් වැඩි වීමෙන් උවමනාවටත් වඩා හිලව් වී ගියේය. ප්‍රධාන වශයෙන් ප්‍රතිපාර්ශ්වීය අරමුදලට බැර කිරීම නිසා ඇතිවන රජයේ මුදල් ශේෂයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 56.0 ක ප්‍රමාණයක් 1967 දී ප්‍රයෝජනයට ගන්නා ලදී. මහ බැංකුවේ අනෙක් වගකීම් හා ගිණුම් රුපියල් දශ ලක්ෂ 13.9 කින් පහළ ගියේ ප්‍රධාන වශයෙන්ම කියතොත් මහ බැංකුවේ සුරැකුම් පත් විසුම් ගැන්වීම නිසාය. මේ අනුව, රාජ්‍ය අංශයේ යයි දැක්විය හැකි මුදල් සැපැයුම වෙත වූ මුළු ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 269.6 ක් විය.

1967 දී පෞද්ගලික අංශය වෙත සැපැයුන දළ වාණිජ බැංකු ණය ප්‍රමාණයේ වැඩිවීම, පසුගිය වර්ෂයට වඩා වැඩි විය. 1966 දී සමුපකාර ආයතනවලට සැපැයුන ණය ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 25.8 කින් වැඩි වූ නමුත්, 1967 දී මෙය වැඩි වූයේ රුපි. දශ ලක්ෂ 7·3 කි. 1967 දී මෙවැනි සුළු වැඩිවීමකට හේතු වූයේ එකිනෙකට පටහැණි හැඩගැසීම් දෙකකි. සහතික මිල ක්‍රමය යටතේ, වී මිල දී ගැනීම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩ බිල්පත් අත්තිකාරම් මුළු ප්‍රමාණය

1. පහත දැක්වෙන විශලේෂනයට 1966 අග හා 1967 අතර වූ සංඛ්‍යාවල වෙනස්වීම පදනම්වී ඇත.

රුපි. දශ ලක්ෂ 35·5 කින් අඩු වූ අතර, 1967 මහ කන්නයේ සිට ක්‍රියාත්මක වූ, විශේෂයෙන් නව කෘෂිකාර්මික ණය සැලසුම් ක්‍රමය යටතේ, සමුපකාර සමිති වලට සැපයුනු අනිකුත් ණය රුපි. දශ ලක්ෂ 42·9 කින් වැඩිවුනි. වර්ෂයේ දී රජයේ සංස්ථාවලට දුන් ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11·4 කින් වැඩිවිය. මෙය 1966 වර්ෂයේ දී සිදු වූ වැඩිවීමට වඩා සුළු වැඩිවීමකි. 1967 දී අනිකුත් පෞද්ගලික අංශයේ ගනුදෙනුකරුවනට සැපයුන බැංකු ණය ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 85·1 කින් වැඩි විය.

පුද්ගලික අංශය වෙත (සමුපකාර සමිති සහ රජයේ සංස්ථා ඇතුළුව) සපයා ඇති බැංකු ණය ප්‍රමාණයෙහි මුළු වැඩිවීම රුපි. දශ ලක්ෂ 103·8 කි. මුදල් සැපයුම කෙරෙහි මෙම ණය වැඩි වීමෙහි ප්‍රසාරණාත්මක බලපෑම, වාණිජ බැංකු වෙත පෞද්ගලික අංශය මගින් තැන්පත් වුනු, රුපි. දශ ලක්ෂ 102·1 ක කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සමුච්චිතයකින් සහ වාණිජ බැංකුවල "අනිකුත් වගකීම් සහ ගිණුම්" හි රුපි. දශ ලක්ෂ 31·0 ක වැඩිවීමකින් උවමනාවටත් වඩා හිලව් වී ගියේය. කාලින හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම් වලින් රුපි. දශ ලක්ෂ 51·2 ක ප්‍රමාණයක් රජයේ සංස්ථා සතු වූ අතර, රුපි. දශ ලක්ෂ 1·4 ක් සහ රුපි. දශ ලක්ෂ 49·5 ක්, පිළිවෙලින්, සමුපකාර සමිති හා අනිකුත් පෞද්ගලික අංශයේ ගනුදෙනු කරුවන් සතු විය. මෙය තුලනයකර බැලීමේ දී, බැංකු ක්‍රමය හා පෞද්ගලික අංශය අතර, පැවැති ගනුදෙනු මගින් මුදල් සැපැයුම කෙරෙහි රුපියල් දශ ලක්ෂ 29·3 ක ශුද්ධ සංකෝචනාත්මක බලපෑමක් සිදුවී ඇත.

දිවයිනෙහි ගෙවුම් ශේෂයෙහි වර්තන ගිණුම් හි වූ රුපි. දශ ලක්ෂ 330 ක හිඟය නිසා විදේශ වත්කම් හා බැංකු ක්‍රමයේ වගකීම් හි රුපි. දශ ලක්ෂ 91·5 ක පිරිහීමක් සිදු විය. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය වැඩි වූයේ රුපි. දශ ලක්ෂ 117·4 කින් පමණි. හැර ගැනීම් (නැවත මිලදී ගැනීම් හැර) හා ගාස්තු ගෙවීම් නිසා අන්තර් ජාතික මූල්‍ය අරමුදල වෙත ඇති තැන්පතු ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 109·2 කින් වැඩි විය. බැංකු මාර්ගයන්ගෙන් ණය ගැනීම් නිසා මහ බැංකුවෙහි විදේශීය වගකීම් ප්‍රමාණය, රුපි. දශ ලක්ෂ 57·1 කින් වැඩි වුනි. මහ බැංකුවේ විදේශීය වගකීම් ප්‍රමාණය තවත් රුපි. දශ ලක්ෂ 49.7 කින් වැඩි වුනේ ප්‍රධාන වශයෙන්ම ද්වි පාර්ශවීය ගෙවීම් ගිවිසුම් යටතේ ලංකාවෙන් ගෙවිය යුතු වූ ශේෂයන් නිසාය. වාණිජ බැංකු වල විදේශීය වත්කම් වැඩි වූයේ රුපි. දශ ලක්ෂ 7.4 කින් පමණි.

විදේශීය අංශය මගින් මුදල් සැපැයුම වෙත පැ රුපි. දශ ලක්ෂ 91.5 ක සංකෝචනාත්මක බලපෑම, 1966 දී වූ රුපි. දශ ලක්ෂ 196.3 න් අඩකට වඩා අඩු විය. අනික් අතට, රාජ්‍යාංශයෙහි කටයුතු මගින්, පසුගිය අවුරුද්දට වඩා තුන් ගුණයකටත් වැඩි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන ලදී. එම අංශයේ රුපියල් දශ ලක්ෂ 269.6 වනාහි, 1959 පසුව ඕනෑම ලිත් වර්ෂයක මෙතෙක් සටහන් වූ ඉහලම ප්‍රමාණය විය. රජය මගින් ආහාර තොග විශාල ප්‍රමාණයක් මිලට ගැනීම, මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 1967 දී යහල් සහ පිටි තොග පිළිවෙලින් ටොන් 37500 සහ 76, 300 කින් වැඩි විය. පෞද්ගලික අංශයෙහි කටයුතු මගින්, මුදල් සැපැයුම වෙත රුපියල් දශ ලක්ෂ 29.3 ක සංකෝචනාත්මක බලපෑමක් ඇති කළ අතර, මෙයට පෙර වර්ෂ කිහිපයකදී ම මේ මගින් ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කෙරුණි මෙම විවිධාකාර බලපෑම් හි, ශුද්ධ ප්‍රතිඵලය වූයේ 1967 දී රුපියල් දශ ලක්ෂ 148.7 කින් මුදල් සැපැයුම ප්‍රසාරණය වීමය.

1. (ඇ) බැංකු නොවූ පෞද්ගලික අංශයෙහි ද්‍රවශීලතාවය

මුදල් සැපැයුමෙහි මහජනයා සතු මූලික ද්‍රවශීල වත්කම් වලින් සැකැසුනා රුපි. දශ ලක්ෂ 148.7 ක ප්‍රසාරණය වීම හැර, ද්විතීය ද්‍රවශීල වත්කම් හි ද රුපියල් දශ ලක්ෂ 191.5 ක වැඩිවීමක් ඇති වූයේය. මේ අනුව, 1967 දී මහජනයා සතු

# සංඛ්‍යා සටහන II (ඇ) 1

## මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1962 සහ 1963 අතර වූ වෙනස % | 1963 සහ 1964 අතර වූ වෙනස % | 1964 සහ 1965 අතර වූ වෙනස % | 1965 සහ 1966 අතර වූ වෙනස % | 1966 සහ 1967 අතර වූ වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. .. | 1,426 | 1,347 | 1,468 | 1,615 | 1,693 | 1,598 | − 5·5 | + 9·0 | +10·0 | + 4·8 | − 5·6 |
| පෙබරවාරි .. .. .. | 1,561 | 1,369 | 1,501 | 1,582 | 1,674 | 1,687 | −12·3 | + 9·6 | + 5·4 | + 5·8 | + 0·8 |
| මාර්තු .. .. .. | 1,635 | 1,385 | 1,505 | 1,585 | 1,666 | 1,817 | −15·3 | + 8·7 | + 5·3 | +5 ·1 | + 9·1 |
| අප්‍රේල් .. .. .. | 1,448 | 1,400 | 1,534 | 1,601 | 1,675 | 1,781 | − 3·3 | + 9·6 | + 4·4 | + 4·6 | + 6·3 |
| මැයි .. .. .. | 1,317 | 1,431 | 1,547 | 1,645 | 1,698 | 1,723 | + 8·6 | + 8·1 | + 6·3 | + 3·2 | + 1·5 |
| ජූනි .. .. .. | 1,298 | 1,448 | 1,550 | 1,650 | 1,692 | 1,731 | +11·5 | + 7·0 | + 6·4 | + 2·5 | + 2·3 |
| ජූලි .. .. .. | 1,277 | 1,447 | 1,543 | 1,693 | 1,757 | 1,718 | +13·3 | + 6·6 | + 9·7 | + 3·8 | — 2·2 |
| අගෝස්තු .. .. .. | 1,270 | 1,474 | 1,529 | 1,674 | 1,702 | 1,678 | +16·1 | + 3·7 | + 9·5 | + 1·7 | — 1·4 |
| සැප්තැම්බර් .. .. .. | 1,294 | 1,499 | 1,549 | 1,675 | 1,681 | 1,700 | +15·8 | + 3·3 | + 8·1 | + 0·4 | + 1·1 |
| ඔක්තෝබර් .. .. .. | 1,317 | 1,505 | 1,592 | 1,687 | 1,682 | 1,761 | +14·3 | + 5·8 | + 6·0 | − 0·3 | + 4·7 |
| නොවැම්බර් .. .. .. | 1,307 | 1,533 | 1,603 | 1,677 | 1,655 | 1,787 | +17·3 | + 4·6 | + 4·6 | − 1 3 | + 8·0 |
| දෙසැම්බර් .. .. .. | 1,343 | 1,506 | 1,622 | 1,716 | 1,659 | 1,808 | +12·2 | + 7·7 | + 5·8 | − 3·3 | + 9·0 |
| මාසික සාමාන්‍ය .. .. | 1,374 | 1,445 | 1,545 | 1,650 | 1,686 | 1,732 | + 5·2 | + 6·9 | + 6·8 | + 2·2 | + 2·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ඇ) 2

## මුදල් සැපැයුමේ වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපැයුම කෙරෙහි බලපෑ සාධක | 1961 අවසානයේ සිට 1962 අවසානය දක්වා | | 1962 අවසානයේ සිට 1963 අවසානය දක්වා | | §1963 අවසානයේ සිට 1964 අවසානය දක්වා | | §1964 අවසානයේ සිට 1965 අවසානය දක්වා | | §1965 අවසානයේ සිට 1966 අවසානය දක්වා | | 1966 අවසානයේ සිට 1967 අවසානය දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. | – | 91·1 | – | 53·2 | 16·9* | – | 79·8† | – | – | 196·3 | – | 91·5 |
| 2. පෞද්ගලික අංශය†† .. | 42·2 | 50·9 | 132·3 | 63·4 | 82·6 | 57·1 | 19·2 | 75·4 | 137·2 | 79·6 | 103·8 | 133·1 |
| (අ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවනට දෙන ලද වෙළෙඳ බැංකු ණය‡ .. | 42·2 | – | 124·2 | – | 82·6 | – | 10·0 | – | 33·5 | – | 85·1 | – |
| (ආ) සමුපකාර ආයතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය .. | – | – | – | – | – | – | – | 6·9 | 25·8 | – | 7·3 | – |
| (ඇ) සමුපකාර ආයතනවල කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු .. | – | – | – | – | – | – | – | 2·1 | – | 2·3 | – | 1·4 |
| (ඈ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවනට දෙන ලද කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | – | 50·2 | – | 63·4 | – | 52·2 | – | 46·2 | – | 65·3 | – | 49·5 |
| (ඉ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) .. | – | 0·7 | 8·1 | – | – | 4·9 | – | 20·2 | – | 12·0 | – | 31·0 |
| රජයේ සමායතන | | | | | | | | | | | | |
| (ඊ) රජයේ සමායතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය .. | – | – | – | – | – | – | 7·8 | – | 27·7 | – | 11·4 | – |
| (උ) වෙළෙඳ බැංකු වෙනැති, රජයේ සමායතනවල කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු .. | – | – | – | – | – | – | 1·4 | – | 50·2 | – | – | 51·2 |
| 3. රාජ්‍යාංශය .. | 250·2 | 94·7 | 166·9 | 19·0 | 133·6 | 58·0 | 120·3 | 53·2 | 207·5 | 125·5 | 269·6 | – |
| (අ) වෙළෙඳ බැංකු වෙනැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් සහ රජයේ ආනයන බිල්පත් .. | 71·3 | – | 20·4 | – | 3·6 | – | 92·3 | – | – | 62·6 | 77·1 | – |
| (ආ) මහ බැංකුව වෙනැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් .. | 175·9 | – | 139·5 | – | 123·2 | – | – | 38·7 | 155·9 | – | 109·9 | – |
| (ඇ) මහ බැංකුව රජයට දුන් අත්තිකාරම් .. | 3·0 | – | 7·0 | – | 6·8 | – | 28·0 | – | 26·4 | – | 12·7 | – |
| (ඈ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) .. | – | 18·6 | – | 10·7 | – | 54·8 | – | 4·5 | 25·2 | – | 13·9 | – |
| (ඉ) බැංකු වෙනැති, රජයේ තැන්පතු හා භාණ්ඩාගාරය හා කච්චේරි වෙනැති මුදල් ශේෂ .. | – | 76·1 | – | 8·3 | – | 3·2 | – | 10·0 | – | 62·9 | 56·0 | – |
| 4. භූවමාරුවෙහි පවත්නා ගිර්ෂය සඳහා ගැලපිලි .. | – | 1·7 | – | 0·2 | – | 2·3 | 3·2 | – | – | 0·1 | – | 0·1 |
| මුළු ප්‍රාසාරණාත්මක සංකෝචනාත්මක සාධක .. | 292·4 | 238·4 | 299·2 | 135·8 | 233·1 | 117·4 | 222·5 | 128·6 | 344·7 | 401·5 | 373·4 | 224·7 |
| මුදල් සැපැයුමෙහි වෙනස .. | +54·0 | | +163·3 | | +115·8 | | +93·8 | | –56·8 | | +148·7 | |

* 1964 පෙබරවාරි මාසයේදී, මහ බැංකුව රුපියල් දශ ලක්ෂ 53·3 ක ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් මිලට ගත් විදේශීය වත්කම් ද ඇතුළත්ය. මෙයට ඉඩ හළවිට ශුද්ධ බැංකු විදේශීය වත්කම් වසර තුල දී ඇත්ත වශයෙන්ම රුපියල් දශ ලක්ෂ 36·4 කින් පහළ වැටී ඇත.

** 1965 මැයි මාසයේදී මහ බැංකුව, රජයේ ආයතන වලින් රුපියල් දශ ලක්ෂ 30·1 ක ප්‍රකාශිත වටිනාකමට මිලට ගත් විදේශීය වත්කම් ද ඇතුළත්ය. මෙයට ඉඩ හළවිට, ශුද්ධ බැංකු විදේශීය වත්කම්හි රුපියල් දශ ලක්ෂ 49·6 ක වැඩිවීමක් පිළිබිඹු වෙයි. රජයේ ආයතන වලට රුපියල් වලින් මිල ගෙවීම හේතු කොටගෙන මුදල් සැපැයුම කෙරෙහි එක එල්ලේම ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇති විය.

†† වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම බැංකු විදේශීය වත්කම් යටතේ ඇතුළත් කැරිණි

‡ රජයේ ආයතන වලට වැඩි වූ මහ බැංකු වගකීම් වලින් රුපියල් දශ ලක්ෂ 53·3 ක්ම රජයේ සමායතන වලට එම වටිනාකමට නිකුත් කරන මහ බැංකු සුරැකුම්පත් වෙයි. කෙසේ වුවද, මෙයින් ශුද්ධ මුදල් වැඩිවීමක් සිදු වී නොමැත.

† සමුපකාර ආයතන වලට හා රජයේ සමායතනවල සංඛ්‍යා තොරතුරු වෙන වෙනම ලබාගත හැක්කේ 1964 – 65 කාලච්ඡේදය සම්බන්ධයෙන් පමණකි. ඊට කලින් කාලච්ඡේදයක් සඳහා වූ මෙම සංඛ්‍යා තොරතුරු "පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවන්" යටතේ ඇතුළත් කැරිණි.

§ ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා හා මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වල හේතුව සංඛ්‍යා සංශෝධනයයි

මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 340.2 කින් වැඩි විය. මෙය ඉකුත් වර්ෂයෙහි වූ රුපියල් දශ ලක්ෂ 108.6 හා සැසඳේ. ද්විතීයික ද්‍රවශීල වත්කම් හි ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් සිදුවූයේ වාණිජ බැංකුවල පැවති කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු ප්‍රමාණයත්, රජයේ පිලිනපත් හා ඉතිරි කිරීමේ සහතික දැරීම් හි වැඩිවීමෙත් ස්වරූපයෙන්ය. 1965-67 කාලච්ඡේදයේ දී, මහජනයා සතු වූ මූලික හා ද්විතීය ද්‍රවශීල වත්කම් බෙදීගිය අයුරු II (ඇ) 3 සංඛ්‍යා සටහනින් පෙන්වා දී ඇත.

### සංඛ්‍යා සටහන II (ඇ) 3

### බැංකු නොවන පෞද්ගලික අංශයේ ද්‍රවශීල වත්කම්

| විස්තර | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1965 | $1966 | 1967 | $1965 | $1966 | 1967 |
| 1· මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. .. | 901·4 | 882·5 | 979·9 | 12·2 | 11·6 | 12·3 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. .. | 814·3 | 776·4 | 827·7 | 11·0 | 10·2 | 10·4 |
| එකතුව .. .. .. | 1715·7 | 1658·9 | 1807 6 | 23·2 | 21·9 | 22·7 |
| වෙනසෙහි සියයට ගණන .. | | − 3·3 | + 9·0 | | | |
| 2· ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙනැති ඉතිරි කිරීම් තැන්පතු .. .. .. | 223·6 | 243·3 | 271·7 | 3·0 | 3·2 | 3·4 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙනැති ඉතිරිකිරීම් තැන්පතු | 427·1 | 438·4 | 439·9* | 5·8 | 5·8 | 5·5 |
| (ඇ) ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙනැති ඉතිරිකිරීම් තැන්පතු .. .. | 86·6 | 91·2 | 90·5* | 1·2 | 1·2 | 1·1 |
| (ඈ) වෙළෙඳ බැංකු වෙනැති කාලීන තැන්පතු .. .. .. | 343·5 | 341·2 | 414·9 | 4·7 | 4·5 | 5·2 |
| (ඉ) මෙරට පදිංචිකරුවන් සතු විදේශිය ශේෂ .. .. .. | 11·5 | 7·3 | 9·6* | 0·2 | 0·1 | 0·1 |
| (ඊ) ඉතිරි කිරීමේ සහතික .. .. | 41·8 | 56·5 | 78·7 | 0·6 | 0·7 | 1·0 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් .. .. | 4·8 | 13·5 | 6·2 | 0·1 | 0·2 | 0·1 |
| (ඌ) බද්ද සංචිත සහතික .. .. | 36·1 | 30·0 | 24·1 | 0·5 | 0·4 | 0·3 |
| (එ) රජයේ පිලිනපත් .. .. | 586·7 | 705·7 | 783·0 | 7·9 | 9·3 | 9.8 |
| එකතුව .. .. .. | 1761·7 | 1927·1 | 2118·6* | 23·9 | 25·4 | 26·6 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 9·4 | + 9·9 | | | |
| 3· පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් | 3477·4 | 3586·0 | 3926·2* | 47·1 | 47·3 | 49·3 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 3·1 | + 9·5 | | | |
| ඉහත සංඛ්‍යා වලට තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙනැති භාණ්ඩාගාර බිල් හා රජයේ පිලිනපත් ඇතුළත් කොට නොමැත .. .. .. | 1229·9 | 1447·9 | 1639·6 | 16·7 | 19·1 | 20·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පවත්නා සාධක මිල අනුව

* තාවකාලිකයි.

$ ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා සහ මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වල හේතුව සංඛ්‍යා සංශෝධනයයි

මූලික ද්‍රවශීල වත්කම් දෙවර්ගයඃවන ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු දැරීම් අතුරතින්, වලංගු මුදල් දැරීම් කෙරේ මහජනයාගේ දියුණු වන ලැදියාව 1967 දී ද දක්නට තිබුණි. සෑම මාසයක් අවසානයේදී ම, මහජනයා විසින්, මුදල් සැපැයු-මෙන් වලංගු මුදලින් දරා සිටි කොටස, ඊට පෙර වර්ෂයේ එම මාසයෙහි රඳවා ගත් ප්‍රමාණයට වඩා වැඩි විය. 1967 දී මාස-අවසාන වලංගු මුදල් දැරීම් ප්‍රමාණයේ

මුදල් සැපැයුමෙන් සියයට 53.2 ක් වූ අතර, මෙය, 1966 දී පැවති සියයට 51.8 හා සැසඳේ. පෙබරවාරියේ දී, බැංකු සේවක වැඩ වර්ජනය පැවති විට දී, සියයට 54 ක් වූ මෙම ප්‍රමාණය වර්ෂයේ සාමාන්‍යයට වඩා වැඩි විය. සැප්තැම්බරයේ දී හා දෙසැම්බරයේ දී වාරික සාධකයන් ගේ බලපෑම හේතු කොටගෙන මෙම ප්‍රමාණය පිළිවෙළින් සියයට 54·4 සහ 54·2 දක්වා වැඩි විය. 11 (ඇ) 4 වැනි සංඛ්‍යා සටහනින්, 1954 සිට සෑම වර්ෂයක් අවසානයේ දී වූ පරිදි, මුදල් සැපැයුමෙහි සැකැසුම පෙන්වා දී ඇත:-

## සංඛ්‍යා සටහන II (ඇ) 4

### මුදල් සැපැයුමෙහි සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| කාලඡෙදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපැයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1954 .. .. | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 .. .. | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1072·9 |
| 1956 .. .. | 401·1 | 35·6 | 725·7 | 64·4 | 1126·8 |
| 1957 .. .. | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1040·1 |
| 1958 .. .. | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1076·8 |
| 1959 .. .. | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1177·7 |
| 1960 .. . | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1208·9 |
| 1961 .. .. | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1288·6 |
| 1962 .. .. | 712·6 | 53·1 | 630·0 | 46 9 | 1342·7 |
| 1963 .. .. | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1506·0 |
| 1964 .. .. | 853·0 | 52·6 | 768·8 | 47·4 | 1621·8 |
| 1965 .. .. | 901·4 | 52·5 | 814·3 | 47·5 | 1715·7 |
| 1966 .. .. | 882·5 | 53·2 | 776·4 | 46 8 | 1658·9 |
| 1967 .. .. | 979·9 | 54·2 | 827·7 | 45·8 | 1807·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1957 සිට මහජනයා තුළ ඉල්ලුම් තැන්පතු වලට වඩා වලංගු මුදල් රඳවා ගැනීමට වැඩි කැමැත්තක් තිබූ බව, මෙම සංඛ්‍යා සටහනින් පෙනී යනු ඇත. 1956 අවසානයේ පැවති මුදල් සැපැයුමෙහි වලංගු මුදල් කොටස වන සියයට 35.6, 1963 අවසානය වන විට, සියයට 55.0 දක්වා ඉහළ ගියේය. අනතුරුව අවුරුදු දෙක තුළ දී, මෙම මහජන කැමැත්තෙහි සැලකිය යුතු අඩුවීමක්, 1965 අවසානයේ දී මුදල් සැපැයුමෙහි වලංගු මුදල් කොටස සියයට 52.5 ට අඩුවීමක් සමග දක්නට ලැබුණි. කෙසේ වෙතත්, 1966 සහ 1967 දී, එය නැවත ඉහළ යමින්, 1967 අවසානයේදී, 1963 නෙහි උපරිම මට්ටමට මදක් පහළින් පිහිටියේය.

මුදල් සැපැයුමෙහි ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය, වර්ෂය තුළ දී අඩුවීමක් දක්වුවද ඉල්ලුම් තැන්පතු වල නිරපේක්ෂ මට්ටමෙහි සුළු වැඩිවීමක් සටහන් විය. 1967 ඉල්ලුම් තැන්පතු වල මාසික සාමාන්‍යය, රුපියල් දශ ලක්ෂ 806.9 ක් වූ අතර, 1966 දී මෙය, රුපියල් දශ ලක්ෂ 805.7 ක් විය. කෙසේ වුවද, ඉල්ලුම් තැන්පතු පිරිවැටුම් අනුපාතිකය වර්ෂය තුළ දී සුළු වශයෙන් අඩු විනි. බැංකු වැඩ වර්ජනය හේතු කොට ගෙන, පෙබරවාරියේ හා මාර්තුවේ දී මෙම අනුපාතිකයෙහි පැහැදිලි පිරිහීමක් දැකිය හැකි විය. වර්ෂයෙහි අවසන් භාගයේ දී පිරිවැටුම් අනුපාතිකය පසුගිය වර්ෂයේ එකී කාලඡේදයේ මට්ටමට ඉතාමත් ආසන්න තත්ත්වයකට පත් වුණි. 1967 ඉල්ලුම් තැන්පතු පිරිවැටුම් අනුපාතිකයෙහි, මාසික සාමාන්‍යය, 1.60 ක් වූ අතර, 1966 හා සැසඳීමේ දී මෙය 1.64 ක් විය.

මූලික ද්‍රවශීල වත්කම් ව්‍යවහාර මුදල් වලින් දැරීමට ඇති වැඩි වන මහජන ලැදියාවත් සමග ම, විශාල අගයන්ගෙන් යුතු ව්‍යවහාර මුදල් නෝට්ටු විශේෂයෙන් රු. 100 යේ හා රු. 50 හේ නෝට්ටු දැරීමට ඇති නැඹුරුව ද වැඩි වී ඇත. පහත දැක්වෙන 11 (ඇ) 5 සංඛ්‍යා සටහනින් 1954 සිට සෑම වර්ෂයක් අවසානයේ වූ පරිදි ව්‍යවහර මුදල් නිකුතුවෙහි සැකැසුම දක්වා ඇත.

**සංඛ්‍යා සටහන II (ඇ) 5**

**ව්‍යවහාර මුදල් සංයුක්තිය-රුපියල් 100, 50, 10 සහ 5 හේ වටිනාකම අනුව**

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේ දී | රුපි. 100 | රුපි. 50 | රුපි. 10 | රුපි 5 | ව්‍යවහාර මුදල් එකතුව * |
|---|---|---|---|---|---|
| 1954 .. .. | 97·6 | 73·1 | 134·9 | 25·3 | 376·2 |
| 1955 .. .. | 113·7 | 88·0 | 145·7 | 28·2 | 425·0 |
| 1956 .. .. | 114·9 | 97·7 | 148·0 | 30·0 | 443·4 |
| 1957 .. .. | 116·5 | 116·7 | 155·8 | 29·9 | 475·1 |
| 1958 .. .. | 157·5 | 143·6 | 184·0 | 33·7 | 578·3 |
| 1959 .. .. | 174·5 | 152·1 | 193·5 | 36·2 | 621·3 |
| 1960 .. .. | 148·4 | 148·4 | 237·6 | 40·1 | 644·6 |
| 1961 .. .. | 211·9 | 180·3 | 254·6 | 42·1 | 763·8 |
| 1962 .. .. | 238·2 | 186·8 | 241·9 | 42·8 | 789·4 |
| 1963 .. .. | 275·3 | 236·7 | 257·6 | 46·5 | 900·9 |
| 1964 .. .. | 168·4 | 258·3 | 359·5 | 55·5 | 932·1 |
| 1965 .. .. | 239·9 | 297·8 | 319·7 | 50·5 | 1002·8 |
| 1966 .. .. | 272·0 | 292·9 | 288·2 | 48·6 | 993·7 |
| 1967 .. .. | 316·2 | 313·1 | 296·3 | 51·3 | 1072·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

*රුපියල් 2 සහ 1 නෝට්ටු හා කාසි සියල්ලම ද අඩංගු වේ.

1967 වර්ෂයේ වලංගු මුදල් නිකුතුවේ මුළු වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 79.1 කින් රුපියල් දශ ලක්ෂ 44.2 කට රුපියල් 100/ නෝට්ටුද, රුපියල් දශ ලක්ෂ 20.2 කට රුපියල් 50/- නෝට්ටු ද විය. පසුගිය වර්ෂයේ මුළු වලංගු මුදල් නිකුතුව රුපියල් දශ ලක්ෂ 9.1 කින් පහළ වැටුණු විට, රුපියල් 100/- නෝට්ටු දැරීම රුපියල් දශ ලක්ෂ 32.1 වැඩි වීමක් පෙන්නුම් කළේය. 1958 සිට 1965 කාලය තුල වූ සෑම වර්ෂයකදීම වලංගු මුදල් නිකුතුවේ වැඩිවීමක් නොකඩවා පැවැති අතර රුපියල් 100/- හා 50/- නෝට්ටු ප්‍රමාණය, මුදල් නිකුතුවේ මුළු වැඩිවීමට වඩා වේගයෙන් වැඩි විය. 1958 සිට අවුරුදු දහයක කාලය තුලදී, මුළු වලංගු මුදල් නිකුතුවේ අඩංගු රුපියල් 100/- සහ 50/- නෝට්ටු ප්‍රමාණය සියයට 52·1 සිට 58 7 දක්වා වැඩිවිය.

බැංකු හර බද්ද පැන වූ පසු බැංකු තැන්පතු වැඩිවීම වැලැක්විමෙන් මුදල් සැපැයුමෙහි තැන්පතු අංගයේ පහළ යාමේ උපනතියක් ඇති වේ යැයි යන හැඟීම විය. 1965 වර්ෂයේ දී මෙම බද්ද අස්කර ගත් නමුදු මෙම උපනතියේ වෙනස්වීමක් ඇති නොවීය. තවද මෙම බද්ද අස්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් පිරිවැටුම් අනුපාතිකයේ පැහැදිළි වැඩිවීමක් නොපෙනින. මුදල් සැපැයුමේ ඉල්ලුම් තැන්පතු අනුපාතිකය නොකඩවා පහළ යාම හා අගය වැඩි නෝට්ටු දැරීමට ඇති නැම්යාව වැඩිවීම, රාශිකරණය හා බදු මග හැරීම පවතින නිසා විය හැක.

ඉල්ලුම් තැන්පතු රටාව පරීක්ෂා කරන විට හෙළිවූයේ පුද්ගලයන් හා ව්‍යාපාරික නොවන ආයතන දරන මුළු ඉල්ලුම් තැන්පතුවලට ඇති අනුපාතය අඩුවීමයි. තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ මහ බැංකු සමීක්ෂණයෙන් ලබාගත්

වෙළඳ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු වල (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සමග) පුළුල් හිමිකම් ගණන අනුව වර්ග කිරීමක්, 11 (ඇ) 6 සංඛ්‍යා සටහනෙන් දැක්වෙයි. ඉල්ලුම් තැන්පතු වල වැඩිවීම ව්‍යාපාරික අංශයට සංකේද්‍රණය වී තිබෙන බව මෙම සටහනෙන් පෙනේ.

### සංඛ්‍යා සටහන II (ඇ) 6

### වෙළෙඳ බැංකු වෙතැති, ඉල්ලුම්, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හිමිකම්

### (කාලච්ඡේදය අවසානයේදී)

රුපියල් දශ ලක්ෂ

| හිමියා | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| මූල්‍ය ආයතන: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 45·4 | 5·9 | 69·0 | 21·3 | 7·7 | 3·4 | 122·1 | 9·3 |
| 1966 දෙසැම්බර්, .. | 45·0 | 6·1 | 55·3 | 17·5 | 9·7 | 4·0 | 110·0 | 8·5 |
| 1967 දෙසැම්බර්, .. | 50·8 | 6·4 | 66·7 | 17·1 | 12·1 | 4·4 | 129·5 | 8·9 |
| වැවිලි: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 78·2 | 10·2 | 34·6 | 10·7 | 0·3 | 0·1 | 113·0 | 8·6 |
| 1966 දෙසැම්බර්, .. | 59·7 | 8·1 | 38·8 | 12·3 | ... | ... | 98·5 | 7·6 |
| 1967 දෙසැම්බර්, .. | 54·2 | 6·8 | 34·3 | 8·8 | 0·2 | 0·1 | 88·7 | 6·1 |
| වෙළෙඳ: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 158·8 | 20·7 | 54·2 | 16·7 | 3·2 | 1·4 | 216·2 | 16·5 |
| 1966 දෙසැම්බර්, .. | 168·9 | 23·0 | 51·0 | 16·1 | 4·0 | 1·6 | 223·9 | 17·3 |
| 1967 දෙසැම්බර්, .. | 162·2 | 20·4 | 83·7 | 21·5 | 3·8 | 1·4 | 249·6 | 17·1 |
| අනෙක් ව්‍යාපාර: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 104·5 | 13·7 | 46·5 | 14·3 | 2·4 | 1·1 | 153·4 | 11·7 |
| 1966 දෙසැම්බර්, .. | 82·6 | 11·3 | 32·6 | 10·3 | 2·8 | 1·1 | 118·0 | 9·1 |
| 1967 දෙසැම්බර්, .. | 155·0 | 19·5 | 49·6 | 12·8 | 3·2 | 1·2 | 207·7 | 14·2 |
| ප්‍රාදේශීය බලමණ්ඩල: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 17·5 | 2·3 | 25·0 | 7·7 | 0·2 | 0·1 | 42·7 | 3·2 |
| 1966 දෙසැම්බර්, .. | 22·9 | 3·1 | 15·6 | 4·9 | 0·6 | 0·2 | 39·1 | 3·0 |
| 1967 දෙසැම්බර්, .. | 23·8 | 3·0 | 20·6 | 5·3 | 0·3 | 0·1 | 44·8 | 3·1 |
| ව්‍යාපාරික නොවන ආයතන: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 52·3 | 6·8 | 19·6 | 6·0 | 4·5 | 2·0 | 76·4 | 5·8 |
| 1966 දෙසැම්බර්, .. | 55·6 | 7·6 | 34·7 | 11·0 | 4·5 | 1·8 | 94·8 | 7·3 |
| 1967 දෙසැම්බර්, .. | 43·0 | 5·4 | 37·9 | 9·7 | 4·5 | 1·6 | 85·4 | 5·9 |
| පුද්ගලයන්: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 308·7 | 40·3 | 75·6 | 23·3 | 205·9 | 91·8 | 590·3 | 44·9 |
| 1966 දෙසැම්බර්, .. | 299·0 | 40·7 | 88·6 | 28·0 | 222·2 | 91·1 | 609·8 | 47·1 |
| 1967 දෙසැම්බර්, .. | 306·2 | 38·5 | 97·1 | 24·9 | 248·1 | 91·1 | 651·4 | 44·7 |
| එකතුව: | | | | | | | | |
| 1965 දෙසැම්බර්, .. | 765·3 | 100·0 | 324·5 | 100·0 | 224·3 | 100·0 | 1314·1 | 100·0 |
| 1966 දෙසැම්බර්, .. | 733·7 | 100·0 | 316·6 | 100·0 | 243·8 | 100·0 | 1294·1 | 100·0 |
| 1967 දෙසැම්බර්, .. | 795·1 | 100·0 | 389·8 | 100·0 | 272·2 | 100·0 | 1457·2 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය සමාගම්වල කටයුතු වල වැඩිවීම තරමක් දුරට නිරූපණය කරමින්, 1967 වර්ෂයේදී මූල්‍ය ආයතන වල සහ බැංකු ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 5.8 කින් ඉහළ ගියේය. අනෙක් අතට අපනයන අංශයේ අවනති තත්ත්වය හේතුකොට ගෙන වතු වැවිලි සම්බන්ධ ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 5.5 කින් පහළ වැටින. වෙළෙඳ ආයතන වල ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 6.7 කින් පහළ යාම, ඒ ආයතන වල කාලීන තැන්පතු දැරීම් නැම්යාව වැඩිවීම නිරූපණය වීමක් විය හැකිය. මුළු ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය සලකන විට, වෙළෙඳ අංශයේ තැන්පතු අනුපාතය 1966 අගදී සියයට 23.0 ක් වූ අතර, 1967 අගදී සියයට 20.4 තෙක්

පහළ වැටුනි. අනෙකුත් ව්‍යාපාර ආයතන වල ඉල්ලුම් තැන්පතු වල වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 72.4 මුළු ඉල්ලුම් තැන්පතු වල ඉහළ යාමට වඩා වැඩිය. ඒ නිසා මෙම වර්ෂයේදී මුළු ප්‍රමාණයට අංශයේ කොටස, සියයට 11.3 සිට සියයට 19.5 දක්වා ඉහළ ගියේය. මේ අංශයේ තැන්පතු වැඩිවුණු ප්‍රමාණයෙන් තරමක් දුරට, වර්ෂය තුළදී ව්‍යාපාරික කටයුතු මට්ටම ඉහල ගිය කාර්මික නිෂ්පාදන ආයතන වල මුදල් ශේෂයන් වැඩිවීම හේතු වූවා විය හැකිය. කෙසේ වෙතත්, එයින් කොටසකින් පෙන්වනුයේ රජයේ සංස්ථාවල ශේෂයන්හි වැඩිවීමය.

1967 දී ව්‍යාපාරික නොවන ආයතනයන් රුපියල් දශ ලක්ෂ 12.6 ක ඉල්ලුම් තැන්පතු පහළ වැටීමකට මුහුණ පෑ අතර, එය කැපී යන පරිදි කාලීන හෝ ඉතිරි කිරීම් තැන්පතු වැඩි නොවින. වතු වැවිලි අංශය හැරුනාම බැංකු තැන්පතු වල පහළ වැටීමක් දක්නට තිබුණේ මෙම අංශයේ පමණි. මුළු ඉල්ලුම් තැන්පතු වෙනුවෙන් ඇති මෙම අංශයේ මුලු ඉල්ලුම් තැන්පතු අනුපාතිකය වර්ෂය තුළදී සියයට 7.6 සිට සියයට 5.4 දක්වා පහළ වැටුනි. පුද්ගලයන්ගේ ඉල්ලුම් තැන්පතු ඉහළ ගියේ රුපියල් දශ ලක්ෂ 7.2 කින් පමණක් වන අතර, මුළු ඉල්ලුම් තැන්-පතු වල ඔවුන්ගේ කොටස සියයට 40.7 සිට සියයට 38.5 තෙක් පහළ වැටුනි.

1967 වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ප්‍රමාණයේ වැඩිවීම ඉතා සතුටුදායකය. පසුගිය වර්ෂයේ දී කාලීන තැන්පතු රුපියල් දශ ලක්ෂ 7.9 කින් පහළ ගියත් මේ වර්ෂයේ දී එය රුපියල් දශ ලක්ෂ 73.2 කින් වැඩිවිණි. ඉතිරි කිරීම් තැන්පතු ද 1966 රුපියල් දශ ලක්ෂ 19.5 හා සංසන්දනය කරන කල රුපියල් දශ ලක්ෂ 28.4 කින් වැඩිවිය. 1967 දී මෙම වැඩිවීමට හේතු වූයේ බැංකු වෙතැති මුළු ඉතිරි කිරීම් තැන්පතු ප්‍රමාණයෙන් සියයට 91 ක් වන, පුද්ගලයන්ගේ ඉතිරි කිරීම් තැන්පතුය. රජයේ පිස්කල් කට-යුතු වල ප්‍රසරණාත්මක බලපෑම හැරෙන්නට වෙනත් සමහර සාධක, බැංකු ක්‍රමය තුළ පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල ඉහළ යාමට හේතු වන්නට ඇත. 1965 සහ 1967 මුල් භාගයේ දී මෙම තැන්පතු වලට ගෙවන පොලී අනුපාතයේ යම් ඉහළ නැගීමක් පෙනෙන්නට තිබුණි. වෙළෙඳ බැංකු වල ශාඛා ව්‍යාප්තිය පුළුල් වීමද, මෙම තැන්පතු හා ඉල්ලුම් තැන්පතු වල ඉහළ යාමට හේතු වන්නට ඇත.

වර්ෂය ආරම්භයේදී, වෙළෙඳ බැංකු වෙත තිබූ මුළු කාලීන තැන්පතු වලින් සියයට 28.0 ක්ම පුද්ගලයන්ගේ තැන්පතු විය. මෙම වර්ෂයේ කාලීන තැන්පතු වල වැඩිවීමේ වේගය මුළු කාලීන තැන්පතු වලට වඩා අඩු වූවත් 1967 අවසානයේ දී සියයට 24·9 ක පැවති මෙම අංශයේ කොටස සංඛ්‍යා සටහන පෙන්වන පරිදි, අන් සියළු වර්ගවලට වඩා විශාලව දක්වුනි.

ව්‍යාපාරික අංශයේ කාලීන තැන්පතු වල සැහෙන අන්දමේ වැඩිවීම් තිබුණි. වෙළෙඳ ආයතන වල කාලීන තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 32.7 කින් වැඩි වූ අතර, මූල්‍ය ආයතන වල රුපියල් දශ ලක්ෂ 11.4 කින් ද, අනෙකුත්

ව්‍යාපාර ආයතන වල රුපියල් දශ ලක්ෂ 17·0 කින් ද වැඩි විය. වතු වැවිලි කර්මාන්තයේ කාලීන තැන්පතු දශ ලක්ෂ 4.5 කින් පහළ වැටුනි. මේ නිසා වෙළෙඳ ආයතන හා අනෙකුත් ව්‍යාපාර ආයතන වල මුළු කොටස් ප්‍රමාණය දියුණු වූ අතර, වතු වැවිලි කර්මාන්ත අංශයේ පිරිහීමක් සටහන් විය. ව්‍යාපාරික අංශයේ කාලීන තැන්පතු වල වැඩිවීම සම්පූර්ණයෙන්ම වාගේ රජයේ සංස්ථා නිසා සිදු විය. ව්‍යාපාරික අංශයෙන් පිටතවූ, ප්‍රදේශීය බල මණ්ඩලව කාලීන තැන්පතු රුපියල් දශ ලක්ෂ 5 කින් වැඩිවූ අතර ව්‍යාපාරික නොවන ආයතන වල වැඩිවීම රුපියල් දශ ලක්ෂ 3·2 කි.

1967 දී වෙළෙඳ බැංකු සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල සාමාන්‍ය මාසික මට්ටම පසුගිය වසරට වඩා ඉහළින් වූ අතර, මෙම තැක්පතු වල පිරි වැටුම් අනුපාතිකයන් ස්ථාවරව පැවතිනි. 1966 රුපියල් මට්ටම වන දශ ලක්ෂ 366·1 හා සසඳන විට කාලීන තැන්පතු සාමාන්‍ය මාසික මට්ටම 1967 රුපියල් දශ ලක්ෂ 383.7 ක් වූ අතර, වර්ෂ දෙකේම පිරිවැටුම් අනුපාතිකය 0.21 ක් විය. ඉතිරි කිරීම් තැන්පතුවල සාමාන්‍ය මට්ටම 1966 රුපියල් දශ ලක්ෂ 231.9 සිට 1967 දී රුපියල් දශ ලක්ෂ 250.2 දක්වා ඉහළ ගිය අතර, වර්ෂ දෙකෙහිම පිරිවැටුම් අනුපාතිකය 0.08 ක් විය.

වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල වර්ධනයට ප්‍රතිවිරුද්ධ ලෙස රජයේ අනුග්‍රහය ලබන ඉතිරි කිරීමේ බැංකු දෙකෙහි තැන්පතු වල සැලකිය යුතු දියුණුවක් නොතිබුණි. මේ වර්ෂ තුළදී තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව වෙතැති තැන්පතු වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 1.5 කින් පමණක් වන අතර, ලංකා ඉතිරි කිරීම් බැංකුවේ සුළු පිරිහීමක් සටහන් විය. අවුරුදු කිහිපයක සිට මෙම තැන්පතු වල වැඩිවීම් වේගයේ පහළ යාමක් තිබුණ නමුත්, මේ ආයතන දෙකෙහි තැන්පතු පරිමාව ස්ථාවරව පැවතුන පළමුවන වර්ෂය 1967 ය. මෙම ආයතන දෙකෙහි තැන්පතු වල සාමාන්‍ය ප්‍රමාණයේ හෝ පිරිවැටුම් අනුපාත වල වෙනසක් නොතිබුණි.

1967 දී පෞද්ගලික අංශයේ ඉතිරි කිරීම් සහතික පත්‍ර දැරීම, රුපියල් දශ ලක්ෂ 22.2 වැඩිවීමක් පෙන්වයි. මෙම වැඩිවීම පසුගිය වර්ෂයේ වැඩිවීමට වඩා රුපියල් දශ ලක්ෂ 7.5කින් වැඩි වන අතර, එය සටහන් වූ විශාලතම වැඩිවීමයි. 1967 මෙම වැඩිවීම සම්පූර්ණයෙන් සිදුවූයේ අවුරුදු 10 යේ ඉතිරි කිරීම් සහතික වලිනි. 1965 බලපැවැත් වූ විශාල බදු සහන හා ඉතිරි කිරීම් සහතික වල සාපේක්ෂ ඵලදාව ඉහල යාම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූවාට සැකයක් නැත. මෙයට ප්‍රති විරුද්ධව, පෞද්ගලික අංශයේ භාණ්ඩාගාර බිල්පත් දැරීම රුපියල් දශ ලක්ෂ 7.3 කින් පහළ වැටුනි.

බැංකු නොවන පෞද්ගලික අංශය මගින් රජයේ පිලිනපත් දැරීම රුපියල් දශ ලක්ෂ 77.3 කින් වැඩි විය. මෙම වැඩිවීම 1966 ට වඩා සුළු වූවත්, සියයට 40·4 ක මුළු ද්විතිය ද්‍රවශීල වත්කම් වැඩිවීමකට හේතු විය. මෙම අංශයේ රජයේ පිලිනපත් හිමිකම, රක්ෂණ සංස්ථාව, රක්ෂණ සමාගම් වැනි ආයතන වලට සහ භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් වලට බොහෝ දුරට සීමා විය. පෞද්ගලික අංශය දරන පිලිනපත් වල වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 48·8 ක තරම් විශාල ප්‍රමාණයකට වගකිවේ රක්ෂණ සංස්ථවයි. භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල්, රුපියල් දශ ලක්ෂ 30·5 කින් ස්වකීය දැරීම් වැඩි කරන ලදී. පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 14·5 ක ඉහළ යාම හා සැසැඳීමේදී පුද්ගලයන්ගේ දැරීම් වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 3·5 කින් පමණි[1]

---

1. රජයේ පිලිනපත් හිමිකම් බෙදීගිය අයුරු සඳහා II (ඇ) 13 වැනි සංඛ්‍යා සටහන බලන්න.

සාරාංශ වශයෙන් බලතොත්, 1967 දී මහජනයා අත වූ ද්‍රවශීල මූල්‍ය වත්කම් ප්‍රමාණයෙහි සාමාන්‍ය වැඩිවීමක් තිබුණි. මූලික හා ද්විතියික ද්‍රවශීල වත්කම් බෙදියාම නොවෙනස්ව පැවතිය ද, ද්විතියික ද්‍රවශීල වත්කම් ව්‍යුහයේ අගේ කළ හැකි වෙනස්කම් දක්නට ලැබුණි. පෞද්ගලික අංශය, ද්විතියික ද්‍රවශීල වත්කම් අතර වන බැංකු ක්‍රමය වෙත වූ හිමිකම් වෙනුවෙන්, වැඩෙන ලැදියාවක් පෙන් වූ අතර, රජයේ සුරැකුම් වගී වෙනුවෙන් සහ රජයේ අනුග්‍රාහක ඉතිරි කිරීමේ ආයතනයන්හි හිමිකම් වෙනුවෙන්, අඩුවන ලැදියාවක් පෙන්විය.

### 1. (ඇ) පොලී අනුපාතික

විමශීනයට භාජනය වන වෂීය මුළුල්ලේම මහ බැංකු පොලිය සියයට 5 හි නොවෙනස්ව පැවතුනි. 1967 අවසාන භාගයේ දී ක්‍රියාත්මක වූ නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ, වගා කරුවන්ට සපයනු ලබන ණය සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත සැපයෙන අත්තිකාරම් සඳහා වූ මහ බැංකුවේ ප්‍රතිමුදල් ණය අත්තිකාරම් පොලිඅනුපාතිකය සියයට 1½ කරනලදී. මධ්‍යම හා දිගු කාලීන ණය අරමුදලෙන් සැපයෙන්නා වූ ප්‍රතිමුදල් ණය වෙනුවෙන්, මහ බැංකුව අය කරන පොලී අනුපාතිකයන්හි ද වෙනසක් නොවීය.

වාණිජ බැංකු වල ණය දීමේ අනුපාතිකයන් හි කිසි වෙනසක් 1967 වෂීය තුළදී සිදුවූයේ නැත. රජයේ සුරැකුම් පත් පදනම් වූ ණය මුදල් සඳහා අවම අනුපාතිකය සියයට 5½ ක් වූ අතර, උපරිම අනුපාතිකය සියයට 7 ක් විය. බද්ධ ව්‍යාපාර සමාගම්හි කොටස් ඇපකොට ලබාගත් ණය මුදල් සඳහා වූ අවම අනුපාතිකය සියයට 7 ක් වූ අතර, වෙළෙඳ තොග ඇපකොට ලබාගත් ණය මුදල් හි අනුපාතිකය සියයට 6 ක් වුණි. මේ දෙවගීයේම ඇපයන් වෙනුවෙන් දුන් ණය මුදල් සඳහා නියම වූ උපරිම අනුපාතිකය සියයට 9 ක් විය. නිශ්චල දේපල වෙනුවෙන් දෙනු ලබන ණය මුදල් සඳහා අවම පොලි අනුපාතිකය සියයට 7 ක් වූ අතර, උපරිම අනුපාතිකය සියයට 9½ ක් වුනි. අනිකුත් වගීයේ ඇපයන් වෙනුවෙන් දුන් ණය මුදල් සඳහා අය කළ පොලී අනුපාතිකය සියයට 5 සහ සියයට 9 අතර, වෙනස් වෙමින් පැවති අතර, ඇප නොමැති ණය සඳහා වූ අනුපාතිකය සියයට 7 සහ 9 අතර වෙනස් විය.

වාණිජ බැංකු වෙතැති කාලීන තැන්පතු සඳහා ගෙවන අවම පොලී අනුපාතිකය 1967 ජනවාරියේ දී සියයට 2½ න් සියයට 3 දක්වා වැඩි වූ අතර, උපරිම අනුපාතිකය නොවෙනස්ව පැවතිණ. වාණිජ බැංකු, තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව සහ ලංකා ඉතිරි කිරීම් බැංකුව වෙතැති ඉතිරි කිරීම් තැන්පතු වෙනුවෙන් නියමව තිබූ අනුපාතිකයන්හි වෙනසක් නොවීය.

වෂීයෙහි වැඩි කාලය තුළ භාණ්ඩගාර බිල්පත් අනුපාතිකය, නොවෙනස්ව පැවති නමුදු, නොවැම්බරයේ දී එය සුලු වශයෙන් වැඩි විය. මාසික නිකුතු වල බර තැබූ සාමාන්‍ය අනුපාතිකය, මුල් මාස දහය තුළදී සියයට 3 ක් සහ නොවැම්බරයේ දී සියයට 3.07 දෙසැම්බරයේදී සියයට 3.20 ද විය. වෂී 20 කින් කල් පිරෙන්නා වූ රජයේ සුරැකුම්පත් වෙනුවෙන් නියම වූ අනුපාතිකය සියයට 4½ හි නොවෙනස්ව පැවතුනි.

**වෙළඳ බැංකු කටයුතු**

1967 වර්ෂයේ වෙළඳ බැංකුවල සම්පත් සැලකිය යුතු ලෙස වැඩි විය. මෙය ප්‍රධාන වශයෙන් සිදුවූයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල ස්වරූපයෙනි. මෙයට අමතරව වෙළඳ බැංකු ඉකුත් වර්ෂයට වඩා විශාල වශයෙන් මහ බැංකුවෙන් ණය ගැනීම උපයෝගී කර ගැනීමෙන් තමන්ගේ ණය දීමේ හැකියාව වැඩි කර ගන්නා ලදී. එනිසා, විමර්ශනයට භාජන වන වර්ෂය තුල දී වෙළඳ බැංකුවල කටයුතුවල, පෞද්ගලික හා රාජ්‍ය අංශයට ණය දීමේ සැලකිය යුතු වැඩි වීමක් නිරූපනය කරයි. පෞද්ගලික අංශයට පසුගිය වර්ෂයේ දී සපයන ලද ණය ප්‍රමාණයෙහි වැඩිවීම වන රුපියල් දශලක්ෂ 92.1 ක හා සසඳන කල, මේ වර්ෂයේ දී සපයා ඇති ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 104.8 ක් විය. රජයට දුන් කෙටි කාලීන ණය, පසුගිය වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 48.0 න් පහල යාම හා සසඳන විට මෙම වර්ෂයේ එය රුපියල් දශ ලක්ෂ 139.5 කින් වැඩි විය. පෞද්ගලික අංශයට දුන් ණය වැඩිවීම, ප්‍රධාන වශයෙන්, කෘෂිකාර්මික සහ වාණිජමය කටයුතු සඳහා වූ අතර, රාජ්‍ය අංශයට දුන් ණය වැඩිවීම ආහාර ආනයනවලට මුදල් යෙදවීම සඳහා විය. ඉන් සෑහෙන කොටසක් තොග රැස්කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

වෙළඳ බැංකුවල ණය දීම් වල සෑහෙන වැඩිවීමක් ඇති වුවද, මුළු තැන්පතු වලට ඇති ද්‍රවශීල වත්කම් වල සාමාන්‍ය අනුපාතය අඩුවූයේ සුළු වශයෙනි. මෙයට හේතු වූයේ ලබාදුන් ණයෙන් වැඩි කොටසක් රජයේ ආනයන බිල්පත් ලෙස වෙළඳ බැංකු සතුව තිබීම හා ඒවා ඔවුන් සතු ද්‍රවශීලවත්කම් වල කොටසක් වීමයි. 1967 වර්ෂයේ දී වෙළඳ බැංකු ඔවුන්ගේ රජයේ සුරැකුම් පත් දැරීම් අඩු කරන ලදී.

**2. (අ) බැංකු ශාඛා ව්‍යාප්තිය**

1963-67 කාල පරිච්ඡේදය තුල බැංකු කාර්යාල ව්‍යාප්ත වී ගිය අයුරු හා මුළු තැන්පතු ප්‍රමාණය, ලාංකික, බ්‍රිතාන්‍යය, ඉන්දීය හා පාකිස්තානු බැංකු අතර බෙදී ගිය අයුරු 11 (ආ) 7 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

**සංඛ්‍යා සටහන II (ආ) 7**

**බැංකු කාර්යාල සහ තැන්පතු බෙදී ගිය අන්දම 1963-1967**

| වර්ෂය | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ප්‍රමාණය රු. ශ. | % | | ප්‍රමාණය රු. ශ. | % | | ප්‍රමාණය රු. ශ. | % | | ප්‍රමාණය රු. ශ. | % |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |
| 1965 | 97 | 1,546 | 100 | 81 | 1,023 | 66 | 12 | 431 | 28 | 4 | 92 | 6 |
| 1966 | 105 | 1,502 | 100 | 89 | 1,003 | 67 | 12 | 419 | 28 | 4 | 80 | 5 |
| 1967 | 133 | 1,637 | 100 | 117 | 1,157 | 71 | 12 | 404 | 25 | 4 | 76 | 5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1963 ආරම්භයේ සිට මේ දක්වා වෙන කිසිම වර්ෂයක නොවූ තරමට 1967 වර්ෂයේ බැංකු ශාඛා විවෘත කරන ලදී. වර්ෂය තුල පිහිට වූ නව බැංකු ශාඛා විසි අට අතුරින් මහජන බැංකුව දහනවයක් ද, ලංකා බැංකුව ඉතිරි නවයද විවෘත කරන ලදී. මහජන බැංකුව ශාඛා 2 ක් කොළඹ විවෘත කළ අතර ඉතිරි ශාඛා පේරාදෙණිය, මහියංගනය, පොල්ගහවෙල, මොරටුව, තිස්සමහාරාමය, වැල්ලවාය, අක්කරෙයිපත්තු

සංඛ්‍යා සටහන II (ඇ) 8

## වෙළඳ බැංකුව වල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

(මාසික සංඛ්‍යා සාමාන්‍යය)

රුපියල් දශ ලක්ෂ

| | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | කාලච්ඡේදය අවසානයේදී 1966 දෙසැ. | කාලච්ඡේදය අවසානයේදී 1967 දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති මුදල් හා මහ බැංකුව ඇති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) | 148 | 139 | 119 | 116 | 132 | 148 | 186 | 164 | 182 | 224 | 233 | 218 | 192 | 229 |
| විදේශීය ශේෂ | 116 | 72 | 50 | 52 | 58 | 54 | 55 | 44 | 49 | 55 | 62 | 57 | 60 | 66 |
| භාණ්ඩාගාර බිල් | 39 | 34 | 16 | 24 | 28 | 51 | 89 | 128 | 73 | 89 | 124 | 80 | 116 | 109 |
| වට්ටම් කළ බිල් | 93 | 100 | 116 | 119 | 115 | 122 | 136 | 114 | 126 | 173 | 175 | 198 | 128 | 289 |
| මුළු ද්‍රවශීල වත්කම් | 396 | 345 | 301 | 311 | 333 | 375 | 466 | 450 | 430 | 541 | 594 | 553 | 496 | 693 |
| මුළු ආයෝජන (1) | 291 | 308 | 296 | 285 | 284 | 290 | 303 | 313 | 330 | 329 | 330 | 300 | 325 | 270 |
| මුළු ලෝන හා අයිරාවන් | 273 | 340 | 363 | 395 | 430 | 435 | 477 | 495 | 633 | 669 | 682 | 809 | 730 | 864 |
| ඉල්ලුම් තැන්පතු (2) | 731 | 721 | 661 | 655 | 657 | 677 | 829 | 789 | 853 | 917 | 949 | 914 | 898 | 936 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු | 206 | 240 | 263 | 300 | 340 | 359 | 380 | 460 | 535 | 572 | 631 | 650 | 603 | 701 |
| මුළු තැන්පතු | 941 | 965 | 926 | 955 | 998 | 1,036 | 1,209 | 1,250 | 1,389 | 1.490 | 1,580 | 1,564 | 1,502 | 1,637 |
| අනුපාතය | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට වූ මුදල් | 20·2 | 19·3 | 18·0 | 17·7 | 20·1 | 21·9 | 22·4 | 20·8 | 21·3 | 24·4 | 24·5 | 23·8 | 21·4 | 24·5 |
| මුළු තැන්පතුවලට වූ මුදල් | 15·7 | 14·4 | 12·9 | 12·1 | 13·2 | 14·3 | 15·4 | 13·1 | 13·1 | 15·0 | 14·7 | 13·9 | 12·8 | 14·0 |
| මුළු තැන්පතුවලට වූ විදේශීය ශේෂ | 12·3 | 7·4 | 5·4 | 5·4 | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 3·7 | 3·9 | 3·6 | 4·0 | 4 0 |
| මුළු තැන්පතුවලට වූ භාණ්ඩාගාර බිල් | 4·1 | 3·5 | 1·7 | 2·5 | 2·8 | 4·9 | 7·4 | 10·2 | 5·3 | 6·0 | 7·8 | 5·1 | 7·7 | 6·7 |
| මුළු තැන්පතුවලට වූ වට්ටම් කළ වාණිජ බිල් | 9·9 | 10·3 | 12·5 | 12·5 | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·1 | 11·6 | 11·1 | 12·7 | 8·5 | 17·6 |
| ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් | 54·2 | 47·9 | 45·5 | 47·5 | 50·7 | 55·4 | 56·2 | 57·0 | 50·4 | 59·0 | 62·6 | 60·5 | 55·2 | 74·0 |
| මුළු තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් | 42·1 | 35·8 | 32·5 | 32·6 | 33·4 | 36·2 | 38·5 | 36·0 | 31·0 | 36·3 | 37·6 | 35·4 | 33·0 | 42·3 |
| මුළු තැන්පතුවලට වූ ආයෝජන | 30·9 | 31·7 | 32·0 | 29·8 | 28·5 | 28·0 | 25·1 | 25·0 | 23·8 | 22·1 | 20·9 | 19·2 | 21·6 | 16·5 |
| මුළු තැන්පතුවලට වූ ලෝන හා අයිරාවන් | 29·0 | 35·2 | 39·2 | 41·4 | 43·1 | 42·0 | 39·4 | 39·6 | 45·6 | 44·9 | 43·2 | 51·7 | 48·6 | 52·8 |

(1) රජය හා රජය ඇප වූ සුරැකුම්පත් සහ මහ බැංකු නිකුතු

(2) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත.

මූලය: ශ්‍රී ලංකා බැංකුව

සමන්තුරේ, කට්ටන්කුඩි, ත්‍රිකුණාමලය, තංගල්ල, මොනරාගල, මාවනැල්ල, අම්බලන්තොට, ඇල්පිටිය, වත්තේගම සහ මතුගම විවෘත කරන ලදී. ලංකා බැංකුව ශාඛා 2 ක් කොළඹ විවෘත කළ අතර, ඉතිරි ශාඛා හැටන්, පෑලියගොඩ, වවුනියාව ගම්පහ, මන්නාරම, අම්බලන්ගොඩ හා පුත්තලම යන ස්ථාන වල විවෘත කරන ලදී.

1967 වර්‍ෂයේ අවසානයේ දී ලංකාවේ බැංකු කාර්‍ය්‍යාල 133 ක් විය. පසුගිය වර්‍ෂයේ මෙන්ම 16 ක් වූ විදේශ බැංකු ශාඛා ගණන එසේම පැවතුනි. සියලුම වෙළඳ බැංකුවල මුළු තැන්පතු වගකීම් වලින් ලාංකික තැන්පතු කොටස, පසුගිය වර්‍ෂයේ අවසානයේ සියයට 67 සිට 1967 වර්‍ෂය අවසානයේ දී එය සියයට 71 දක්වා වැඩි විය. මහජන බැංකුව විසින් ආරම්භ කළ නව වෙළඳ බැංකු ශාලාවලට, අමතරව, විමර්‍ශනයට භාජන වන වර්‍ෂය තුල දී තවත් ග්‍රාමීය බැංකු 14 ක් විවෘත කොට මුළු ග්‍රාමීය බැංකු සංඛ්‍යාව 27 ක් කරන ලදී.

**2 (අ) බැංකු වගකීම් ව්‍යුහය.**

11 (ඇ) 9 සංඛ්‍යා සටහනින් 1956/67 කාලය තුළ බැංකු වගකීම් හා වත්කම් බෙදී ගිය ආකාරය සාරාංශකොට දක්වයි.

වෙළඳ බැංකුවල මුළු වත්කම්/වගකීම්, 1967 දෙසැම්බර් මාසය වන විට රු. දශ ලක්‍ෂ 276 කින් රුපියල් දස ලක්‍ෂ 2122.7 දක්වා වැඩිවිය. 1966 වර්‍ෂයේ සියයට 1.8 කින් වැඩිවීම හා සසඳ බලන විට මේ වර්‍ෂය සියයට 15 වැඩිවීමක් දක්වයි.

මෙම වගකීම වල වැඩිවීම, ප්‍රධාන වශයෙන් රුපියල් දස ලක්‍ෂ 153.4 කින් වැඩි වූ පෞද්ගලික ගනුදෙනු කරුවන්ගේ තැන්පතු වල ද, රුපියල් දස ලක්‍ෂ 81.3 කින් වැඩි වූ වෙනත් වගකීම් වල සහ රුපියල් දශ ලක්‍ෂ 53.1 කින් වැඩි වූ අන්තර් බැංකු ණය ගැනීම් වලින් පිළිබිඹු වෙයි. වෙළඳ බැංකුවල ගෙවා නිමි ප්‍රාග්ධනය සංචිත අරමුදල් සහ නොබෙදූ ලාභ රුපියල් දශ ලක්‍ෂ 7.3 කින් වැඩිවිය. රජයේ තැන්පතු හා දේශීය අන්තර් බැංකු තැන්පතු රුපියල් දශ ලක්‍ෂ 18.2 කින් හා රුපියල් දශ ලක්‍ෂ 0.7 කින් ද විදේශ බැංකුවලින් ගත් ණය රුපියල් දශ ලක්‍ෂ 0.9 කින් ද අඩුවිය. මෙසේ වගකීම්වල දළ වැඩිවීම රුපියල් දශ ලක්‍ෂ 276.3 ක් විය.

විමර්ශනයට භාජනය වූ වර්‍ෂය තුල වගකීම්වල වෙනස්වීමෙහි වඩාත් වැදගත් සිද්ධිය වූයේ, පසුගිය වර්‍ෂයේ රුපියල් දශ ලක්‍ෂ 17.4 කින් පමණක් වූ වැඩිවීම, හා සසඳ බලන විට, පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු මෙම වර්‍ෂයේ රුපියල් දශ ලක්‍ෂ 102.1 කින් වැඩිවීමයි. පෞද්ගලික අංශයේ ඉල්ලුම් තැන්පතු ද රුපියල් දශ ලක්‍ෂ 51.3 කින් වැඩිවූයේ පසුගිය වර්‍ෂයේ එය රුපියල් දශ ලක්‍ෂ 32.6 කින් අඩු වී තිබිනි. වෙළඳ බැංකුවල තිබූ, රජයේ තැන්පතු පෙර වර්‍ෂයට වඩා රුපියල් දශ ලක්‍ෂ 9.9 කින් අඩුවිය. මහ බැංකුවෙන් රුපියල් දශ ලක්‍ෂ 59.3 ණය ගැනීමෙන්ද, වෙනත් දේශීය අන්තර් බැංකු ණය ගැනීම රුපියල් දශ ලක්‍ෂ 6.2 කින් අඩු වීමෙහිද දළ ප්‍රතිඵලය වූයේ අන්තර් බැංකු ණය ගැනීම් රුපියල් දශ ලක්‍ෂ 53.1 කින් වැඩිවීමය.

**(ඇ) බැංකු වත්කම් ව්‍යුහය**

වෙළඳ බැංකු සතු වඩාත් වැදගත් වර්ගවල වත්කම් හැසිරීම 11 (ඈ) 9 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

1967 වර්ෂයේ තුළ දී බැංකු වත්කම් වැඩිවීම ප්‍රධාන වශයෙන්, රුපියල් දශ දක්ෂ 133.7 කින් වැඩි වූ ණය හා අයිරාවලින් ද, රුපියල් දශ ලක්ෂ 159.8 කින් වැඩි වූ ඔවුන් සතු ආනයන බිල්පත් වලින්ද පිළිබිඹු වෙයි. මෙයට අමතරව අතැති හා මහ බැංකුවෙන් ලැබිය යුතු මුදල් රුපියල් දශ ලක්ෂ 36·2 කින් වැඩි වූ අතර වෙළඳ බැංකුවල සංචර හා වෙනත් වත්කම් රුපියල් දශ ලක්ෂ 57·7 කින් වැඩි විය. මෙම වත්කම්වල වැඩිවීම, රුපියල් දශ ලක්ෂ 62·3 කින්ද වෙළඳ බැංකු සතු වූ රාජ්‍ය හා රාජ්‍ය ඇප වූ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් අඩුවීමෙන්ද, එකතු වෙමින් තිබුණු මුදල් ශීෂී රුපියල් දශ ලක්ෂ 50·2 කින් අඩුවීමෙන්ද තරමක් දුරට මගහැරිනි.

ණය හා පිළිනපත් වල ප්‍රමාණවත් වැඩිවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය වර්ෂයේ සියයට 43·2 කින් වැඩිවූ මුළු තැන්පතුවලට ණය හා අයිරාවල සාමාන්‍ය අනුපාතය, 1967 වර්ෂයේ සියයට 51·7 දක්වා වැඩිවිය. කෙසේ වෙතත් මුළු තැන්පතු වලට ද්‍රවශීල වත්කම්වල සාමාන්‍ය අනුපාතය සියයට 37·6 සිට සියයට 35.4 දක්වා සුළු අඩුවීමක් සිදුවිය. මෙයට හේතුව තම ද්‍රවශීල වත්කම්වලින් කොටසක් වූ, වෙළඳ බැංකු සතු වූ ආනයන බිල්පත් විශාල ලෙස වැඩිවීමයි. වර්ෂය අවසාන ශේෂය හා බලන විට මුළු තැන්පතුවලට ද්‍රවශීලවත්කම් අනුපාතය පසුගිය වර්ෂයේ පැවති ශේෂය වන සියයට 33.0 සිට විමර්ශනායට භාජනය වන වර්ෂයේ දී සියයට 42·3 දක්වා වැඩිවිය. වර්ෂාවසානයේදී වෙළෙඳ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයේ වර්ධනයට බොහෝ සෙයින්ම හේතු වූයේ වර්ෂය අවසන් වනවිට ආනයන බිල්පත් වැඩිවීමය.

මුළු තැන්පතුවලට මුදල් වල අනුපාතය ගැන බලන විට එම රටාවම පැනනගී. සාමාන්‍ය මාසික අනුපාතය 1966 වර්ෂයේ සියයට 14·7 සිට විමර්ශනයට භාජන වූ වර්ෂයේ සියයට 13.9 දක්වා අඩුවුවද, වර්ෂය අවසානයේ අනුපාතය සියයට 12·8 සිට සියයට 14·0 දක්වා වැඩිවිය

## 2 (ඇ) මූල්‍ය අරමුදල් ලබාගත් මාර්ග හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

1967 දී රජය සහ පෞද්ගලික යන අංශ දෙකම විසින් වාණිජ බැංකු අරමුදල් වැඩියෙන් ප්‍රයෝජනයට ගනු ලැබීය. ප්‍රධාන වශයෙන් ම රජයේ අනයන පියවීම් මගින් රජය වෙත සැපයුන ඉහළ ගිය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 139·5 ක් විය. තවද, වාණිජ බැංකු වෙත වූ තැන්පතු වලින් රුපියල් දශ ලක්ෂ 18.2 ක් රාජ්‍ය අංශය මගින් හැර ගනු ලැබීය. පසුගිය වර්ෂයේ දී වානිජ බැංකු වෙත වූ තැන්පතු පහළ දැමීම මගින්, රාජ්‍ය අංශයෙහි බැංකු අරමුදල් ප්‍රයෝජනයට ගැනීම වැඩි කළේ රුපියල් දශ ලක්ෂ 28·1 කින් පමණි.

විමර්ශනයට භාජනය වි ඇත. වර්ෂයේ දී දේශීය පෞද්ගලික අංශය වානිජ බැංකු වල අරමුදල් ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශ ලක්ෂ 162·5 කින් වැඩි කළ අතර, 1966 දී ඉහළ යාම වන රුපියල් දශ ලක්ෂ 129·3 හා මෙය සැසැඳේ. පුද්ගලික අංශයට දෙන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 104·8 කින් වැඩි වූ අතර, වාණිජ බැංකු වල 'වෙනත් වත්කම්' රුපියල් දශ ලක්ෂ 57.7 කින් ඉහළ ගියේය. පසුගිය වර්ෂයේ දී මෙන් නොව වානිජ බැංකු වෙත වූ පෞද්ගලික අංශයෙහි තැන්පතු වල පහළ වැටීමක් දක්නට නොතිබුණි.

විදේශීය අංශය මගින් වාණිජ බැංකු අරමුදල් ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශ ලක්ෂ 7·3 කින් වැඩි වූයේ, බොහෝ වශයෙන්, වාණිජ බැංකු වල වූ විදේශීය ශේෂ දැරීම්හි ඉහළ යාම නිසාය. විමර්ශනයට ලක්වන වර්ෂයේ දී වාණිජ බැංකු ඔවුන්ගේ දේශීය මුදල් ශීර්ෂ දැරීම ද රුපියල් දශ ලක්ෂ 36.2 කින් වැඩි කරගනු ලැබීය.

සංඛ්‍යා සටහන II (ඇ) 9

**1964—1967 බැංකු සම්පත් වාර්ෂිකව වෙනස් වූ අයුරු සහ ඒවා යෙදවූ අයුරු.**

රුපියල් දශ ලක්ෂ

| | 1964 | 1965 | §1966 | 1967 |
|---|---|---|---|---|
| **මුදල් ලැබුණු මාර්ගය** | | | | |
| 1. **රාජ්‍ය අංශය** .. | 2·9 | 11·8 | 62.7 | 62.3 |
| ණය ගැනීම වැඩිවීම .. | — | — | — | — |
| බැංකු වෙතැති රජයේ ණයපත් අඩුවීම .. | — | — | 14.7 | 62.3 |
| තැන්පතු වැඩිවීම .. | 2·9 | 11.8 | — | — |
| රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය අඩුවීම .. | — | — | 48.0 | — |
| 2. **මහ බැංකුවෙන් ණය ගැනීම වැඩිවීම** .. | — | — | 36,4 | 59.3 |
| 3. **දේශීය පෞද්ගලික අංශය** .. | 154·9 | 148.8 | 34.2 | 242.0 |
| තැන්පතු වැඩිවීම .. | 143·8 | 85.0 | — | 153.4 |
| සංචිත හා ගෙවන ලද ප්‍රාග්ධන ආදිය වැඩිවීම .. | 4·4 | 9.1 | 16.0 | 7·3 |
| අනෙකුත් වගකීම් වැඩිවීම .. | — | 54·7 | 18.2 | 81·3 |
| අනෙකුත් වත්කම් අඩුවීම .. | 6·7 | — | — | — |
| 4. **විදේශ අංශය** .. | — | 11.5 | 0.7 | 1·0 |
| ණය ගැනීම් වැඩිවීම .. | — | 1.2 | 0.7 | — |
| තැන්පතු වැඩිවීම .. | — | 1·3 | — | 1·0 |
| විදේශිය ශේෂ අඩුවීම .. | — | 9.0 | — | — |
| 5. **දේශීය මුදල් ශීර්ෂ අඩුවීම** .. | — | — | 40.1 | — |
| සම්පත් වල මුළු වැඩිවීම .. | 157·8 | 172.1 | 174.1 | 364·6 |
| **මුදල් යෙදවූ අයුරු** | | | | |
| 1. **රාජ්‍ය අංශය** .. | 8·7 | 92.3 | 28.1 | 157·7 |
| ණය ගැනීම් අඩුවීම .. | 5·0 | — | — | — |
| බැංකු වෙතැති රජයේ ණයපත් වැඩිවීම .. | 0·4 | 32·8 | — | — |
| රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය වැඩිවීම .. | 3·3 | 59.5 | — | 139·5 |
| තැන්පතු අස්කර ගැනීම .. | — | — | 28·1 | 18·2 |
| 2. **මහ බැංකුවෙන් ණය ගැනීම අඩුවීම** .. | 18 8 | 12.8 | — | — |
| 3. **දේශීය පෞද්ගලික අංශය** .. | 63·9 | 47.9 | 129.3 | 162·5 |
| අත්තිකාරම් වැඩිවීම .. | 62·8 | 4·2 | 92.1 | 104·8 |
| අනෙකුත් වගකීම් අඩුවීම .. | 1.1 | — | — | — |
| අනෙකුත් වත්කම වැඩිවීම .. | — | 43·7 | 22.1 | 57·7 |
| තැන්පතු අස්කර ගැනීම .. | — | — | 15.1 | — |
| 4. **විදේශිය අංශය** .. | 22.1 | — | 17.0 | 7·3 |
| ණය ගැනීම අඩුවීම .. | 0·8 | — | — | 0·9 |
| තැන්පතු අස්කර ගැනීම .. | 0.1 | — | 1.9 | — |
| විදේශිය ශේෂ වැඩිවීම .. | 21.2 | — | 15·9 | 6·4 |
| 5. **දේශීය මුදල් ශීර්ෂ වැඩිවීම** .. | 43.7 | 18 7 | — | 36·2 |
| යෙදවූ සම්පත් වල වැඩිවීම .. | 157.2 | 171.7 | 174.4 | 363·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

§ ඉකුත් වාර්ෂික වාර්තාවල සංඛ්‍යා සහ මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම් වලට හේතුව සංඛ්‍යා සංශෝධනයයි.

සමාලෝචනය මේ වර්ෂය තුළ දී වාණිජ බැංකු වලට වැඩි වැඩියෙන් ණය දීමට හැකි වූයේ ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 153.4 කින් තරම් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවීම ද, රුපියල් දශ ලක්ෂ 62.3 කින් ඔවුන්ගේ රජයේ පිළිනපත් දැරීම අඩුවීමද සහ රුපියල් දශ ලක්ෂ 59.3 කින් මහ බැංකුවෙන් ගත් ණය මුදල් වැඩිවීම ද හේතු කොට ගෙනය.

පෞද්ගලික අංශයේ තැන්පතු වැඩිවීම සමන්විත වූයේ, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 102·1 කින් සහ ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 51.3 කින් වැඩිවීමෙනි. මෙයට වෙනස් ලෙස ඉකුත් වර්ෂයේ පෞද්ගලික

අංශයේ තැන්පත් රුපියල් දශ ලක්ෂ 15·1 කින් අඩු විය. මෙය සිදුවූයේ ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 32·6 කින් අඩුවීමත් කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 17.4 කින් වැඩිවීමත් හේතු කොට ගෙනය.

රාජ්‍ය අංශයෙන් පැමිණි සම්පත් ප්‍රමාණය රු. දශ ලක්ෂ 62·3 ක් පමණක්වූ අතර, මෙම අංශයේ බැංකු අරමුදල් ප්‍රයෝජනයට ගැනීම රු. දශ ලක්ෂ 157.7 ක් විය. මේ අතර වාණිජ බැංකුවල වැඩි වූ සම්පත් වලින්, මෙයට ප්‍රති විරුද්ධ ලෙස දේශීය පෞද්ගලික අංශය ප්‍රයෝජනයට ගත්තේ ඔවුන්ගේ තැන්පතුවලින් කොටසක් පමණි. පෞද්ගලික අංශය ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රමාණය හැර එම අංශයෙන් එක්වන අතිරික්ත සම්පත් සහ මහ බැංකුවෙන් වැඩියෙන් ණය ගැනීමෙන් විමශීනයට ලක්වන වර්ෂය තුළදී, රාජ්‍ය අංශය වෙත වැඩි වැඩියෙන් ණය මුදල් සැපයීමට වාණිජ බැංකුවලට හැකිවිය. අනෙක් අතට, ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය මගින්, ලැබුණු අධික ප්‍රමාණයක සම්පත් වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශය වෙත ණයට දෙනු ලැබිය.

4. (ඉ) පෞද්ගලික අංශයට බැංකු ණය

1966 දී පෞද්ගලික අංශය වෙත සැපයුණු වාණිජ බැංකු ණය ප්‍රමාණය, ඉහත වර්ෂයේ වැඩිවීම වූ රු. දශ ලක්ෂ 92.1 හා සැසැඳීමේදී රු. දශ ලක්ෂ 104.8 කින් ඉහල ගියේය.

11 (ඈ) 10 වැනි සංඛ්‍යා සටහනින්, 1966 හා 1967 අවසානයේදී ප්‍රධාන වාණිජ බැංකු ණය වර්ගයන් බෙදී ගිය අයුරු දකුවා ඇත.

### සංඛ්‍යා සටහන II (ඈ) 10

### පෞද්ගලික අංශයට* දෙන ලද වෙළෙඳ බැංකු අත්තිකාරම්
### 1966 දෙසැම්බර් - 1967 දෙසැම්බර්

රුපියල් දශ ලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියලු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1966† දෙසැ. | 1967 දෙසැ. | වෙනස | 1966 දෙසැ. | 1967 දෙසැ. | වෙනස | 1966† දෙසැ. | 1967 දෙසැ. | වෙනස |
| අ. එකතු කෙරිගෙන යන මුදල් ගිර්ෂයන්** .. | 105·3 | 55·5 | —49·8 | 1·8 | 1·4 | — 0·4 | 107·1 | 56·9 | — 50·2 |
| ආ. මෙරට බිල්පත් .. | — | — | — | — | — | — | — | — | — |
| ඇ. ආනයන බිල්පත් .. | 21·1 | 32·9 | +11·8 | 14·2 | 22·7 | + 8·5 | 35·3 | 55·6 | + 20·5 |
| ඈ. අපනයන බිල්පත් .. | 11·5 | 10·3 | — 1·2 | 40·9 | 43·1 | + 2·2 | 52·4 | 53·4 | + 1·0 |
| ඉ. අයිරාවන් .. | 166·4 | 188·4 | +22·0 | 225·5 | 230·5 | + 5·0 | 391·9 | 418·9 | + 27·0 |
| ඊ. ණය .. | 303·8 | 385·8 | +82·0 | 34·3 | 59·0 | +24·7 | 338·1 | 444·8 | +106·7 |
| එකතුව .. | 608·1 | 672·9 | +64·8 | 316·7 | 356·7 | +40·0 | 924·8 | 1029·6 | +104·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව,

* රජයේ සමායතන ද ඇතුළුව.

** අය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත් වැනි අන්තර් බැංකු ණය, මේ ගණයෙහි අඩංගු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි බැංකු විසින් සහතික මිල ක්‍රමය යටතේ, ආහාර ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා සමූපකාර ආයතනයන්ට දෙනු ලැබූ ඉතා කෙටි කාලීන අත්තිකාරම්ය මෙහි බෙහෙවින්ම ඇත්තේ.

† මෙම සංඛ්‍යා, පසුගිය වාර්තාවල පලකර ඇති අනුරූප සංඛ්‍යා වලින් වෙනස්වනුයේ, සංශෝධන හේතු කොට ගෙනය.

එකතු වෙමින් පැවති මුදල් ශීඝ්‍රයන්, විමශීනයට ලක්වන කාලච්ඡේදය තුළ දී රුපියල් දශ ලක්ෂ 50.2 කින් පහළ වැටුණු අතර, ඉකුත් වර්ෂයේ රු. දශ ලක්ෂ 36.0 ක වැඩිවීම හා එය සැසඳේ. මෙම වර්ෂයේ ණය අඩුවීමට මූලික හේතුව වූයේ, 1966 දෙසැම්බරයේ දී සහල් සලාකය අඩු කිරීමෙන් පසුව වී සඳහා වූ නිදහස් වෙළඳ පොල පුලුල් වීම නිසා සහතික මිල ක්‍රමය යටතේ සමුපකාරයන් වෙත සැපයුණු භාණ්ඩ කුවිතාන්සි අත්තිකාරම්හි පහළ වැටීමය.

1967 දී වානිජ බැංකු විසින් දරණු ලැබූ පෞද්ගලික අංශයෙහි ආනයන බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 20.3 කින් ඉහළ ගිය අතර, වර්ෂය අවසානයේ දී මෙම බිල්පත්හි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 55.6 ක් විය. ඉකුත් වර්ෂයේ දී වාණිජ බැංකු දරූ පෞද්ගලික අංශයේ ආනයන බිල්පත් රුපියල් දශ ලක්ෂ 14.4 කින් පහළ වැටුනේය. වානිජ බැංකු විසින් දරණ ලද ආකෘත බිල්පත් වලින් වැඩි කොටසක් දරුවේ ලාංකික බැංකු විසිනි.

බැංකු මගින් දරූ අපනයන බිල්පත්හි වටිනාකම වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 1 කින් පමණි. විදේශීය බැංකු විසින් දරණ ලද ආනයන බිල්පත් වටිනාකම රුපියල් දශ ලක්ෂ 2.2 කින් ඉහළ ගිය අතර, ලාංකික බැංකු විසින් දරණ ලද මෙම බිල්පත්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 1·2 කින් අඩු විය. සියලුම බැංකු මගින් දරණු ලැබූ අපනයන බිල්පත්හි මුළු වටිනාකමින් ප්‍රධාන කොටස, විදේශක බැංකු විසින් තව දුරටත් දරණු ලැබීය.

1967 දෙසැම්බරය අවසානයේ දී, ඉතිරිව තිබූ ආයිරාවන්හි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 418.9 ක ප්‍රමාණයක් වූ අතර, පසුගිය වර්ෂයේ දෙසැම්බරය අවසානයේදී ඉතිරිව පැවති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 27.0 කින් වැඩි විය. 1967 දෙසැම්බරය අවසානයේදී පැවති මුළු අයිරාවන් ප්‍රමාණයෙන් විදේශීක බැංකු විසින් දෙන ලද අයිරාවන් ලාංකික බැංකු විසින් දෙන ලද අයිරාවන් ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 42·1 කින් වැඩි විය.

1967 දී ඉතිරිවූ ණය මුදල්හි වටිනාකම, ඉකුත් වර්ෂයේ වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 56·4 හා සැසැදීමේදී රුපියල් දශ ලක්ෂ 106·7 කින් ඉහළ ගියේය. 1967 දී වූ ඉතිරි ණය මුදල්හි වටිනාකමෙහි ශුද්ධ වැඩිවීම, සමුපකාර ආයතන සහ අනිකුත් පෞද්ගලික ආයතනයන් වෙත දුන් ණය, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 49.1 කින් සහ රුපියල් දශ ලක්ෂ 62.0 කින් ඉහළ යාමේ සහ රජයේ සංස්ථාවලට සැපයුණු ණය මුදල් රුපියල් දශ ලක්ෂ 4·5 කින් පහල යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. සමුපකාර ආයතනයන් වෙත සැපයුණු ණය මුදල් වැඩිවීම් වලින් කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ දෙනු ලැබූ වගා ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 44.4 ක් විය.

වර්ෂය තුළදී වාණිජ බැංකු ණය ප්‍රමාණය ඒකාකාරව තිබුනේ නැත. පෙබරවාරි සහ මාර්තුවේදී වූ බැංකු සේවක වැඩ වර්ජනයේ හේතුවෙන් මාසික සාමාන්‍යයට වඩා කිහිප ගුණයකින් ඉහළ ගිය ආරම්භක වැඩිවීමකින් පසුව, මැයි සිට අගෝස්තුව දක්වා වූ කාලච්ඡේදයේදී ණය ප්‍රසාරණයෙහි හීනවීමක් ඇති වූයේය. සැප්තැම්බර් – දෙසැම්බර් කාලච්ඡේදයේ දී ණය ප්‍රසාරණයක් දකිය හැකිවිය. 1967 දී ණය ප්‍රසාරණයේ සාමාන්‍ය මාසික වැඩිවීම රුපියල් දශ ලක්ෂ 8.7 ක් විය.

පෞද්ගලික අංශය වෙත ඉහළ ප්‍රමාණයකින් ණය තිබිද්දීත් මුදල් සැපයුම වෙත මෙම අංශයේ කටයුතුවලින් ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති නොවූයේ වාණිජ බැංකු වෙතවූ එම අංශයෙහි කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම හා වානිජ බැංකුවල අනෙකුත් වගකීම් වැඩිවීම මගින් ණය මැවීමේ ප්‍රසාරණාත්මක බලපෑම උවමනාවටත් වඩා හීලව්වී ගිය හෙයිනි.

අරමුණු හා කල්පිරීම අනුව බැංකු අත්තිකාරම් වර්ග කිරීමක් සංඛ්‍යා සටහන I (ඇ) 11 මගින් දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (ඇ) 11

### අත්තිකාරම් අරමුණු හා කල්පිරීම අනුව

රුපියල් දශ ලක්ෂ

| අරමුණ | | කෙටිකාලීන 6 මාසයට අඩු | | මැදි කාලීන (6 මාසයේ සිට මාස 30 දක්වා) | | දිගු කාලීන (මාස 30 ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | (2) 7 හි % වශයෙන් (1) | (3) | (4) 7 හි % වශයෙන් (3) | (5) | (6) 7 හි % වශයෙන් (5) | (7) | (8) එකතුවෙහි % වශයෙන් 7 |
| අ. වාණිජ | †1966 දෙසැම්බර් .. | 201.2 | 42.7 | 183.4 | 39.0 | 85.9 | 18.3 | 470.6 | 57.2 |
| | 1967 ජූනි .. .. | 183.0 | 39.0 | 205.4 | 43.7 | 81.1 | 17.3 | 469.5 | 53.5 |
| | 1967 දෙසැම්බර් .. | 206.1 | 41.1 | 200.1 | 39.9 | 94.7 | 18.9 | 500.9 | 51.3 |
| ආ. මූල්‍ය | 1966 දෙසැම්බර් .. | 30.2 | 31.6 | 35.3 | 36.9 | 30.2 | 31.5 | 95.7 | 11.6 |
| | 1967 ජූනි .. .. | 30.5 | 31.2 | 37.7 | 38.5 | 29.6 | 30.2 | 97.9 | 11.1 |
| | 1967 දෙසැම්බර් .. | 36.9 | 35.5 | 35.0 | 33.7 | 32.0 | 30.8 | 103.9 | 10.6 |
| ආ. කෘෂිකාර්මික | 1966 දෙසැම්බර් .. | 8.7 | 21.5 | 17.7 | 43.8 | 13.9 | 34.4 | 40.4 | 4.9 |
| | 1967 ජූනි .. .. | 13.8 | 26.8 | 17.6 | 34.2 | 20.1 | 39.0 | 51.5 | 5.9 |
| | 1967 දෙසැම්බර් .. | 27.7 | 27.0 | 52.4 | 51.2 | 22.3 | 21.8 | 102.4 | 10.5 |
| ඇ. කාර්මික | †1966 දෙසැම්බර් .. | 29.9 | 34.2 | 30.8 | 35.3 | 26.5 | 30.4 | 87.3 | 10.6 |
| | 1967 ජූනි .. .. | 63.3 | 53.6 | 25.6 | 21.7 | 29.1 | 24.6 | 118.1 | 13.5 |
| | 1967 දෙසැම්බර් .. | 60.7 | 51.0 | 29.1 | 24.4 | 29.2 | 24.5 | 119.1 | 12.2 |
| ඇ. පාරිභෝජනය | 1966 දෙසැම්බර් .. | 15.1 | 20.1 | 27.0 | 35.9 | 33.1 | 44.0 | 75.2 | 9.1 |
| | 1967 ජූනි .. .. | 19.7 | 24.0 | 25.4 | 31.0 | 36.8 | 44.9 | 82.0 | 9.3 |
| | 1967 දෙසැම්බර් .. | 29.5 | 30.5 | 25.9 | 26.8 | 41.2 | 42.6 | 96.6 | 9.9 |
| ඉ. අනෙකුත් ණය | 1966 දෙසැම්බර් .. | 21.6 | 40.7 | 17.5 | 33.0 | 13.9 | 26.2 | 53.0 | 6.4 |
| | 1967 ජූනි .. .. | 26.3 | 44.7 | 19.3 | 32.8 | 13.2 | 22.4 | 58.9 | 6.7 |
| | 1967 දෙසැම්බර් .. | 23.2 | 43.6 | 17.1 | 32.1 | 12.8 | 24.1 | 53.2 | 5.4 |
| ඊ. එකතුව | †1966 දෙසැම්බර් .. | 306.8 | 37.3 | 311.8 | 37.9 | 203.6 | 24.8 | 822.2 | 100.0 |
| | 1967 ජූනි .. .. | 336.7 | 38.4 | 331.0 | 37.7 | 210.1 | 23.9 | 877.8 | 100.0 |
| | 1967 දෙසැම්බර් .. | 384.1 | 39.3 | 359.6 | 36.8 | 232.4 | 23.8 | 976.1 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* ලෝන, අයිරාවන් හා වට්ටම් කරන ලද බිල්පත් අත්තිකාරම් වලට ඇතුලත් වේ. එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුලත් නොවේ.

† මෙම සංඛ්‍යා, පසුගිය වර්ෂවල සංඛ්‍යා වලින් වෙනස්වනුයේ සංශෝධන හේතු කොට ගෙනය.

වර්ෂය තුළදී වෙළඳ බැංකු වලින් කෘෂිකාර්මික අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය[1] අනෙක් සෑම අරමුණකටම දෙන ලද ප්‍රමාණයට වඩා නිරපේක්ෂක වශයෙන් හා මුළු අත්තිකාරම් ප්‍රමාණයේ අනුපාතයක් වශයෙන් ඉහළ ගියේය.

1967 දී පැවති මෙම අත්තිකාරම් වල ප්‍රමාණය රුපියල් දසලක්ෂ 62.0 කින් ඉහළ ගියේය. මුළු අත්තිකාරම්වල එම කොටස ඉකුත් වර්ෂය අවසානයේ පැවති

1 මහ බැංකු කටයුතු යටතේ, බැංකු වර්ධනය හා සම්බන්ධ අංශය බලන්න.

රුපියල් දසලක්ෂ 10·5 සිට සියයට 4·9 කින් 1967 අවසානය වන විට පැහැදිලිව වැඩි විය. වර්ෂයේ අවසාන මාස හතර තුළදී සිදුවූ අත්තිකාරම් වල වැඩිවීමෙන් සියයට 60 ක් පමණ නව කෘෂිකාර්මික ණය ක්‍රමය*යටතේ දුන් වගා ණය වල ස්වරූපය ගත්තේය. වර්ෂය තුළදී වතු වගාවන් සඳහා දෙන අත්තිකාරම් වලද ඉහලයෑමක් සටහන් විය.

වෙළඳ අරමුණු සඳහා දෙන ණය රුපියල් දසලක්ෂ 30·3 කින් 1967 දී වැඩි විය. කෙසේ වෙතත් මුළු ගණනෙන් මෙම අත්තිකාරම් වල ප්‍රතිශතය ඉකුත් වර්ෂයේ අවසානයේ පැවති සියයට 57·2 සිට 1967 අගවන විට සියයට 51·3 දක්වා පහළ ගියේය. මෙම අත්තිකාරම් වල වැඩිවීම ප්‍රධාන වශයෙන් යෙදවූයේ අපනයන වලට මුදල් යෙදවීම සඳහාය. සුළු වශයෙන් අභ්‍යන්තර වෙළඳම සඳහා ද යෙදවිනි. 1967 දී අපනයන සඳහා පැවති ඉහළ මට්ටමක අත්තිකාරම් ප්‍රමාණය, ආධාර වැඩ පිළිවෙලවල් යටතේ වැඩි වැඩියෙන් ගලා ආ අපනයන දේශීය.වශයෙන් මුදල් කිරීම සඳහා අවශ්‍ය වීම නිරූපණය කරයි.

කාර්මික අරමුණු සඳහා ලබාදුන් අත්තිකාරම් අගය 1967 දී රුපියල් දසලක්ෂ 31·8 කින් ඉහල ගියේය. කෙසේ වෙතත් මුළු අත්තිකාරමෙන් ඒවායේ ප්‍රමාණ ඉකුත් වර්ෂය අවසානයේ පැවති සියයට 10·6 සිට සියයට 12·2 දක්වා 1967 අගදී පහළ වැටුනි. එසේම මුදල් අරමුණු සඳහා ලබා දුන් අත්තිකාරම් ප්‍රමාණය සම්බන්ධ-යෙන් පෙනී යනුයේ සමාලෝචනය කරන වර්ෂය තුළදී මුළු ප්‍රමාණය දශලක්ෂ 8·2 කින් ඉහළ ගියත්, මුළු අත්තිකාරම් වෙනුවෙන් මෙකී අත්තිකාරම් වල ප්‍රතිශතය සියයට 11·6 සිට සියයට 10·6 දක්වා පිරිහුණු බවයි.

පාරිභෝජන අරමුණු සඳහා දුන් අත්තිකාරම් 1967 දී රුපියල් දසලක්ෂ 21·4 කින් වැඩිවිය. මුළු අත්තිකාරම්වල මේවාට හිමි ප්‍රතිශතය 1966 අග පැවති සියයට 9·1 සිට සියයට 9·9 දක්වා සමාලෝචනය කරන වර්ෂය අවසානයේදී වැඩිවිය. අනෙකුත් අරමුණු සඳහා දෙන ණයවල අගය 1966 අගදී පැවති රුපියල් දසලක්ෂ 53·0 සිට රුපියල් දසලක්ෂ 53·2 දක්වා 1967 අගවන විට මඳකින් වැඩිවිය. කෙසේවෙතත් මෙම ණය වල ප්‍රතිශතය මුළු අත්තිකාරම්වල සියයට 6·4 සිට සියයට 5·4 දක්වා පහළ ගියේය.

1967 දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයනු ලැබූ අත්තිකාරම්හි කාලීන ව්‍යුහය, පසුගිය වර්ෂය හා සැසැඳීමේදී ඉතා සුළු වෙනසක් පමණි පෙන්වූයේ. මුළු අත්තිකාරම්වල වූ, කෙටි කාලීන අත්තිකාරම් කොටස සුළු වශයෙන් වැඩිවී 1966 අවසානයේ පැවති සියයට 37·3 සිට 1967 අවසානයේදී සියයට 39·3 දක්වා ඉහළ ගියේය. අනුරූප අන්දමින්, මධ්‍යම හා දිගුකාලීන අත්තිකාරම් කොටස පිළිවෙලින්, සියයට 37·9 සිට සියයට 36·8 දක්වාද; සියයට 24·8 සිට සියයට 23·8 දක්වා ද පහළ වැටුනේය.

II (ඇ) 12 වැනි සංඛ්‍යා සටහන මගින් පොලී අනුපාතිකයන් අනුව අත්තිකාරම්හි වර්ගීකරණයක් දක්වා ඇත.

පසුගිය වර්ෂයෙහි වූ පරිදි, ඉතිරි වූ අත්තිකාරම්හි විශාලම ප්‍රමාණය වූයේ, සියයට 6½ සහ 8 අතර වූ පොලී අනුපාතිකයන් හා සම්බන්ධ ඒවා විය. මෙම පරතරය අතරට වැටුණු ඉතිරිවූ අත්තිකාරම්හි වටිනාකම, රුපියල් දසලක්ෂ 691·9 ක ප්‍රමාණයක් වූ අතර, 1966 අවසානයේ දී, ඉතිරිව පැවති මෙවැනි අත්තිකාරම්හි එකතුවට වඩා රුපියල් දසලක්ෂ 108·3 කින් වැඩිවිය. එහෙත් සියයට 75·6 ක්ව පැවති මෙම අත්තිකාරම් කොටස 1967 අවසානයේදී, සියයට 74·7 දක්වා සුළු

---

* මහ බැංකු කටයුතු යටතේ ඇති 'කෘෂිකාර්මික ණය' කොටස බලන්න.

## සංඛ්‍යා සටහන II (ඇ) 12

## අත්තිකාරම් – පොලී අනුපාතිකයන් අනුව

| පොලී අනුපාතිකය | 1966 දෙසැම්බර් 31 | | 1967 ජූනි 30 | | 1967 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| 2½ අඩු .. .. | 5·1 | 0·7 | 8·9 | 1·1 | 4·9 | 0·5 |
| 2½ .. .. | 0·2 | ... | 0·9 | 0·1 | 1·8 | 0·2 |
| 3 .. .. | 0·2 | ... | 0·2 | ... | 0·3 | ... |
| 3½ .. .. | 1·3 | 0·2 | 1·3 | 0·2 | 1·0 | 0·1 |
| 4 .. .. | 4·7 | 0·6 | 1·2 | 0·1 | 1·8 | 0·2 |
| 4½ .. .. | 5·7 | 0·7 | 5·9 | 0·7 | 12·3 | 1·3 |
| 5 .. .. | 25·7 | 3·3 | 24·7 | 3·0 | 29·1 | 3·1 |
| 5½ .. .. | 27·1 | 3·5 | 32·8 | 4·0 | 32·8 | 3·5 |
| 6 .. .. | 66·1 | 8·6 | 93·3 | 11·4 | 60·4 | 6·5 |
| 6½ .. .. | 119·7 | 15·5 | 139·8 | 17·1 | 156·7 | 16·9 |
| 7 .. .. | 212·4 | 27·5 | 254·1 | 31·0 | 261·4 | 28·3 |
| 7½ .. .. | 112·8 | 14·6 | 83·2 | 10·2 | 106·8 | 11·5 |
| 8 .. .. | 138·7 | 18·0 | 115·4 | 14·1 | 167·0 | 18·0 |
| 8½ .. .. | 5·5 | 0·7 | 5·9 | 0·7 | 11·8 | 1·3 |
| 9 සහ ඊට වැඩි .. | 46·6 | 6·1 | 50·9 | 6·3 | 76·8 | 8·3 |
| එකතුව .. | 771·7 | 100·0 | 818·6 | 100·0 | 925·1 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිලට ගත් අපනයන බිල්පත් හා එකතු කෙරී ගෙන යන මුදල් ශීර්ෂයන් ද අයත් නොවේ.

වශයෙන් පහළ වැටුනි. විමර්ශනයට ලක්වන වර්ෂාවසානයේදී, සියයට 6 සහ ඉන් පහළ පොලී අනුපාතිකයන් අනුව සපයනු ලැබූ අත්තිකාරම්හි වටිනාකම රුපියල් දසලක්ෂ 144·4 ක්වූ අතර, පසුගිය වර්ෂාවසානයේදී මෙම පොලී අනුපාතික පරතරය තුලම සපයනු ලැබූ අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දසලක්ෂ 136·1 ක් විය. වර්ෂය තුළදී මෙම පොලී අනුපාතිකයන් අනුව සැපයුණු අත්තිකාරම්හි වටිනාකම ඉහළ ගියද, මුළු අත්තිකාරම් අතර වූ මේවායේ කොටස පසුගිය වර්ෂාවසානයේදී සියයට 17·6 න් 1967 අවසානයේදී සියයට 15·4 දක්වා පහළ වැටුනි.

සියයට 8½ සහ ඉන් පහළ පොලී අනුපාතයන් අනුව සපයනු ලැබූ අත්තිකාරම් 1967 අවසානයේදී රුපියල් දස ලක්ෂ 36·5 කින් වැඩිවී රුපියල් දස ලක්ෂ 88·6 දක්වා ඉහළ ගියේය. මෙම පොලී අනුපාතිකයන් අනුව සැපයුණු අත්තිකාරම් කොටසද, 1966 අවසානයේදී ඉතිරිව පැවති මුළු අත්තිකාරම් වලින් සියයට 6.8 කින්, 1967 අවසානයේදී සියයට 9·6 දක්වා වැඩිවිය.

ඇප වර්ගයන් අනුව අත්තිකාරම්හි වර්ග කිරීමක් II (ඇ) 13 සංඛ්‍යා සටහනින් දක්වේ. ලිඛිත සුරැකුම්පත් වෙනුවට දුන් අත්තිකාකරම්වල අගය ඉකුත් වර්ෂයේ අගදී පැවති රුපියල් දශ ලක්ෂ 124·0 සිට 154·6 දක්වා 1967 අග වනවිට වැඩි විය. මුළු ගණන වෙනුවෙන් ඒවායේ ප්‍රතිශතය ඉහළ ගියේ මද වශයෙනි. එනම් සියයට 15.1 සිට 15.8 දක්වාය. රජයේ සුරැකුම්පත් වෙනුවෙන් දුන් අත්තිකාරම් ප්‍රමාණයේ අගයත්, සාපේක්ෂක වැදගත් කමත්, 1967 දී වැඩි විය. මේ වර්ගයේ සුරැකුම් වෙනුවෙන් දුන් අත්තිකාරම් අගය ඉකුත් වර්ෂයේ අගදී පැවති රුපියල් 7.2 සිට රුපියල් දශ ලක්ෂ 14.8 දක්වා 1967 අගදී වැඩි විය. මෙකී අත්තිකාරම් වල අගය වැඩි වූයේ දෙගුණයකින් වුවත්, මුළු අත්තිකාරම් වෙනුවෙන් ඒවායේ ප්‍රතිශතය සියයට 0·9 සිට සියයට 1.5 දක්වා වැඩිවිය. බද්ධ ව්‍යාපාර සමාගම්වල

කොටස් වෙනුවෙන් ලබාදුන් අත්තිකරම්වල සාපේක්ෂ ප්‍රතිශත තත්ත්වය වර්ෂය මුළුල්ලේම සියයට 1·8 නොවෙනස් පැවැත්තේය. එකී අත්තිකාරම් අගය ඉකුත් වර්ෂය අග පැවති රුපියල් දශ ලක්ෂ 14·5 සිට රුපියල් දශලක්ෂ 17·8 දක්වා සමාලෝචනය කරන වර්ෂ අගදී වැඩිවිය.

**සංඛ්‍යා සටහන II (ඈ) 13**

**අත්තිකාරම්* ඇප වර්ග අනුව**

| | 1966 දෙසැම්බර් 31 | | 1967 ජූනි 30 | | 1967 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| ලේඛන ගත බිල්පත් .. | 124·0 | 15·1 | 130·8 | 14·9 | 154·6 | 15·8 |
| රජයේ සුරැකුම්පත් .. | 7·2 | 0·9 | 11·7 | 1·3 | 14·8 | 1·5 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. | 14·5 | 1·8 | 16·6 | 1·9 | 17·8 | 1·8 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල වටිනාකම ඇතුළුව) .. | 54·4 | 6·6 | 59·9 | 6·8 | 51·3 | 5·3 |
| වෙළෙඳ තොග .. | 192·1 | 23·4 | 203·0 | 23·1 | 200·4 | 20·5 |
| නිශ්චල දේපොල .. | 90·7 | 11·0 | 91·2 | 10·4 | 102·4 | 10·5 |
| අනෙකුත් .. | 260·0 | 31·6 | 279·0 | 31·8 | 349·1 | 35·8 |
| අප රහිත .. | 79·4 | 9·7 | 85·7 | 9·8 | 85·6 | 8·8 |
| එකතුව . | 822·2 | 100·0 | 877·8 | 100·0 | 976·1 | 100·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් ඇතුලත් නොවේ.

1967 වර්‍ෂයේ දී කාලීන ඉතිරි කිරීමේ තැන්පතු සහ ජීවිත රක්‍ෂණ සහතිකවල මුදල් අගය වෙනු වෙන් දෙනලද අත්තිකාරමේ වටිනාකම හා එහි කොටස පහළ ගියේය. ඉකුත් වර්ෂ අවසානයේ පැවති රුපියල් දශ ලක්ෂ 54·4 සිට 1967 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 51·3 දක්වා මෙම අත්තිකාරම්වල වටිනාකම පහළ ගිය අතර, මෙම කාලඡේදය තුළදී මෙම අත්තිකාරම්වල සමානුපාතය සියයට 6·6 සිට සියයට 5·3 දක්වා පහළ වැටුණි. වෙළඳ භාණ්ඩ තොග වෙනුවෙන් දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය 1966 අග පැවති රුපියල් 192·1 සිට 1967 අගදී රුපියල් දශ ලක්ෂ 200·4 දක්වා ඉහළ ගියත්, මුළු අත්තිකාරම් ප්‍රමාණයෙන් වර්ෂයේ කොටස සියයට 23·4 සිට 20·5 දක්වා පහළ වැටුණි නිශ්චල දේපලවෙනුවෙන් දෙන ලද අත්තිකාරම් වල වටිනාකම ද මෙසේම, ඉකුත් වර්ෂය අවසානයේදී පැවති රුපියල් දසලක්ෂ 90·7 සිට විමර්ශනයට භාජනය වන වර්ෂයේදී රුපියල් දසලක්ෂ 102·4 දකුවා ඉහළ ගියත්, එම කාලඡේදය තුළදී මෙම අත්තිකාරම් වල සාපේක්‍ෂක තත්ත්වය සියයට 11·0 සිට සියයට 10·5 දක්වා පහළ වැටුණි. 'අනෙකුත්' යනුවෙන් වෙන්කොට ඇති ඇප වෙනුවෙන් දුන් අත්තිකා රම්වල ප්‍රමාණය මෙන්ම සමානුපාත වශයෙන් ද ඉහළ ගියේය. 1967 අගදී එවැනි ඇප වෙනුවෙන් දෙන ලද අත්තිකාරම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 349·1 ක් වූ අතර එම ප්‍රමාණය ඉකුත් වර්ෂ අවසානයේ ඒ සඳහා වූ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 89·1 කින් ඉහළ ගොස් තිබුණි. මෙම කාලඡේදයේදීම මෙම අත්තිකාරම් වල සාපේක්‍ෂක සමානුපාතය සියයට 31·6 සිට සියයට 35·8 දක්වා වැඩිවිය. ඇප රහිතව දුන් අත්තිකාරම්වල මුළු ප්‍රමාණය ඉකුත් වර්ෂ අවසානයේ පැවති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 6·2 කින් වැඩිවී, විමර්ශනයට භාජනය වන වර්ෂය අවසානයේදී

රුපියල් දශ ලක්ෂ 85·6 ක් විය. මුළු අත්තිකාරම් වලට සමානුපාත වශයෙන් මෙම ප්‍රමාණය, ඉකුත් වර්ෂය අගදී තිබූ සියයට 9·7 සිට 1967 වර්ෂය අගදී සියයට 8·8 දක්වා අඩුවිය.

### (3) ඉතිරි කිරීම් හා දිගු කාලීන ණය දෙන ආයතන

රජයේ අනුග්‍රහ ලබන ඉතිරි කිරීම් සහ ණය දෙන දිගු කාලීන ආයතන වල ගණුදෙනු 11 (ඇ) 14 යන සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

#### සංඛ්‍යා සටහන II (ඇ) 14

#### දිගු කාලීන ණය දෙන ආයතනයන්ගේ ණය ගනුදෙණු

රුපියල් දහස් ගණනින්

| | 1964 | | 1965 | | §1966 | | 1967 | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය |
| සංවර්ධන මුදල් සමායතනය* .. | 7,231 | 27,802 | 4,010 | 28,316 | 4,540 | 29,052 | 3,150 | 29,154 |
| ලංකා ඉතිරි කිරීම් බැංකුව .. | 3,935 | 15,528 | 2,845 | 16,366 | 2,249 | 16,371 | 3,880 | 17,887 |
| කෘෂිකාර්මික හා කාර්මික ණය ආයතනය .. .. | 5,774 | 31,018 | 4,942 | 32,424 | 3,933 | 32,342 | 2,565 | 31,119 |
| රජයේ උකස් බැංකුව .. .. | 3,532 | 54,662 | 3,942 | 54,681 | 4,959 | 55,319 | 4,812 | 55,453 |
| ණය මණ්ඩලය .. .. | 1,107 | 12,113 | 540 | 11,411 | 833 | 10,970 | 1,225 | 11,047 |
| ජාතික නිවාස දෙපාර්තමේන්තුව** | 2,762 | 70,621 | 5,138 | 71,536 | 16,861 | 84,196 | 25,585 | 1,05 485 |
| එකතුව .. .. | 24,341 | 2,11,744 | 21,417 | 2,14.734 | 33,375 | 2,28,250 | 41,217 | 2,50,145 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* සාමාන්‍ය කොටස් ආයෝජනය ද ඇතුළුනි.

** මෙහි සංඛ්‍යා ඔක්තෝබර්/සැප්තැම්බර් මුදල් වර්ෂයට අදළ වෙයි. මෙම සංඛ්‍යා වලින් පුද්ගලයන්ට හා ගොඩනැගිලි සමාගම් වලට පමණක් දෙන ලද ණය දැක්වේ. 1964/1967 දක්වා වූ වර්ෂයන් සඳහා නොබේරා ඇති ප්‍රමාණයට ගොඩනැගිලි සමාගම් වලට දෙන ලද ණය ඇතුළත් නොවේ.

ඉතිරි කිරීමේ හා දිගු කාලීන ණය දීමේ යෙදී සිටින ආයතන විසින් 1967 දී සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7·8 කින් ඉහල ගිය අතර, මෙය ඉකුත් වර්ෂයේ වැඩිවීම වන රුපියල් දශ ලක්ෂ 12·0 හා සැසඳේ. 1967 අවසානයේදී පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 250·1 ක්වූ අතර, මෙය ඉකුත් වර්ෂය අග පැවති ප්‍රමානයට වඩා රුපියල් දශ ලක්ෂ 21·9 කින් වැඩිය.

ණය දීම්හි වැඩිවීම ප්‍රධාණ වශයෙන් සැකසුනේ ජාතික නිවාස දෙපාර්තමේන්තුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව පිළිවෙලින් දුන් රුපියල් දශ ලක්ෂ 8·7 හා රුපියල් දශ ලක්ෂ 1·6 මගිනි. සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කෘෂිකර්මි හා කාර්මික ණය සංස්ථාව මගින් ලබාදුන් ණය ප්‍රමාණයද රුපියල් දශ ලක්ෂ 1·4 කින් පහල ගියේය.

11 (ඇ) 15 සංඛ්‍යා සටහනෙන් දෙන ලද පරිදි, 1967 අගදී පැවැති ඉතිරි කිරීමේ තැන්පතු හා ඉතිරි කිරීමේ සහතිකවල මුළු අගය ඉකුත් වර්ෂය අගදී පැවැති ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 121·1 කින් වැඩිය. වෙළඳ බැංකුවල

§ ඉකුත් වර්ෂික වාර්තා වල සංඛ්‍යා සහ මෙම සංඛ්‍යා අතර ඇති වෙනස්කම්වල හේතුව සංඛ්‍යා සංශෝධනයයි.

ඇති කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 98·2 කින් ඉහළ යෑම සහ ඉතිරි කිරීමේ සහතිකවල අගය රුපියල් දශ ලක්ෂ 22·2 කින් ඉහළ යෑම, ඉතිරි කිරීමේ තැන්පතු හා සහතික වල අගය ඉහළ යෑමට මුළුමනින්ම වාගේ හේතු විය. 1967 දී සේවක අර්ථසාධක අරමුදලේ මුළු අය එකතු කිරීම් රුපියල් දශ ලක්ෂ 74·4 ක් වය. මෙය ඉකුත් වර්ෂයේ රුපියල් දශලක්ෂ 68·1 හා සැසඳේ.

### සංඛ්‍යා සටහන II (ඇ) 15

### ඉතිරි කිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සහතික

රුපියල් දශ ලක්ෂ

| | 1966 දෙසැම්බර් | 1967 දෙසැම්බර් | වෙනස 66 දෙසැ:/ 67 දෙසැ: |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව .. | 438·4 | 439·9* | + 1·5 |
| ලංකා ඉතිරි කිරීම් බැංකුව .. | 91·2 | 90·5 | — 0·7 |
| වෙළෙඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු)** .. .. | 602·6 | 700·8 | + 98·2 |
| නොපියවූ ඉතිරි කිරීම් සහතික .. | 56·5 | 78·7 | + 22·2 |
| එකතුව .. .. | 1,188·7 | 1,309·9* | +121·2* |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* තාවකාලිකයි.

** රජය සතු තැන්පතු ඇතුළත්ය.